# 141

# වාර්ෂික වාර්තාව

# 2024




# PSMPA

# රාජ්‍ය සේවා අන්‍යොන්‍යාධාර අර්ථසාධක සංගමය

# රාජ්‍ය සේවා අන්‍යෝන්‍යාධාර අර්ථසාධක සංගමය

# 141 වන වාර්ෂික වාර්තාව

| | 2024 | 2023 | 2022 | 2021 | 2020 |
|---|---|---|---|---|---|
| ලාභය | **4,152,370 | 119,379,593 | 94,327,939 | 64,333,050 | 53,976,949 |
| පොලී | 7.00% | 6.00% | 5.80% | 4.40% | 4.00% |
| මුළු වත්කම් | 2,399,016,439 | 2,222,944,540 | 1,759,829,755 | 1,603,139,624 | 1,476,363,872 |

*2024 වර්ෂයේ දී සාමාජික දායක මුදල් හා පොලී ශේෂය මත 7% ක පොලී මුදලක් ගණනය කිරීමෙන් අනතුරුව ලාභය

**සාමාජිකයන් වෙත කෙරෙන නිවේදනයයි.**

1. **බැංකු ටෙලර් යන්ත්‍ර (CDM) මඟින් සංගමයට මුදල් ගෙවීම් සිදු නොකරන ලෙස කාරුණිකව දන්වා සිටිමු.**

2. සාමාජික ණය ගෙවීම් සෘජුවම ලංකා බැංකු සහ මහජන බැංකු ශාඛා මඟින් සිදු කෙරෙන බැවින් ඔබගේ ගිණුම් අංකය සහ ශාඛාව නිවැරදිව දන්වා එවන මෙන් හා ණය අයදුම්පත් වලද එම විස්තර නිවැරදිව සටහන් කරන මෙන් ඉල්ලා සිටිමු.

3. **සාමාජිකයන්ගේ ස්ථාන මාරුවීම්, විශ්‍රාම යාම් හා පෞද්ගලික ලිපිනය වෙනස් වීම් සිදු වූ වහාම, ඒ පිළිබඳ තොරතුරු යාවත්කාලීන කිරීම සඳහා ඒකාබද්ධ ලේකම් හා භාණ්ඩාගාරික වෙත දන්වා එවන මෙන් ඉල්ලා සිටිමු.**

4. නව ඒකාබද්ධ වැටුප / විශ්‍රාම වැටුප මත දායක මුදල් නිවැරදිව අයකර සංගමයට නොපමාව එවීම සාමාජික ඔබගේ වගකීම වන අතර එමගින් ඔබ ලබන ප්‍රතිලාභ තව දුරටත් වර්ධනය කිරීමට හැකි වනු ඇත. මාස 06 ක් අඛණ්ඩව සාමාජික මුදල් අය නොවීමෙන් ඔබගේ වටිනා සාමාජිකත්වය අහෝසි වී යැමට ඉඩ ඇති අතර, මේ හේතුවෙන් ඔබගේ ඇවෑමෙන් පසු යැපෙන්නන්ට හිමි රු.75,000/- දක්වා වන මරණ පාරිතෝෂිකය ද අහිමි වනු ඇත.

### වැදගත්

109 වන මහා සභාවේ දී සම්මත කළ යෝජනාව පරිදි **ජාතික හැඳුනුම්පත, වැඩිහිටි හැඳුනුම්පත, විදේශ ගමන් බලපත්‍රය, විශ්‍රාම හැඳුනුම්පත හෝ රියදුරු බලපත්‍රය** රැගෙන එන **සාමාජික , සාමාජිකාවන් පමණක්** රැස්වීම් ශාලාවට ඇතුළත් කර ගනු ලැබේ. ප.ව.12.30 න් පසු කිසිදු සාමාජිකයෙකු රැස්වීම් ශාලාවට ඇතුළත් කර ගනු නොලැබේ.

**<u>141 වන වාර්ෂික මහා සභා රැස්වීම කැඳවීමේ නිවේදනය</u>**

1891 අංක 5 හා සංශෝධිත 474 අධිකාරිය වන රාජ්‍ය සේවා අන්‍යොන්‍යාධාර අර්ථසාධක සංගම් ආඥා පනතේ 18(1) වගන්තිය ප්‍රකාර සංගමයේ,

**141 වන වාර්ෂික මහා සභා රැස්වීම**

2025 අගෝස්තු මස 30 වෙනි දින (සෙනසුරාදා )

දින පෙ.ව. 8.45 ට කොළඹ 07, රාජකීය මාවතේ පිහිටි

**රාජකීය විද්‍යාලයීය “ නව රඟහලේ ” දී**

ආරම්භ වන බව මෙයින් දන්වා සිටිනු ලැබේ.

මහා සාමාජිකත්වයට ලබාදී ඇති 141 වන වාර්ෂික වාර්තාවට න්‍යාය පත්‍රය ඇතුළත් කොට ඇති බවත් මෙයින් වැඩි දුරටත් දන්වා සිටිනු ලැබේ.

# පටුන


| | | පිටුව |
|---|---|---|
| 1. | රැස්වීම කැඳවීමේ නිවේදනය | 01 |
| 2. | න්‍යාය පත්‍රය | 03 |
| 3. | 2024 වර්ෂය සඳහා ජොෂ්ඨ සාමාජිකත්ව දීමනා හිමි නාමලේඛනය | 04-05 |
| 4. | 2023 අ.පො.ස(උ/පෙළ) ප්‍රතිඵල මත ශිෂ්‍යත්වලාභීන් පිළිබඳ තොරතුරු | 06 |
| 5. | නිල යෝජනා | 06-09 |
| 6. | පෞද්ගලික යෝජනා | 09-12 |
| 7. | නාම යෝජනා | 13-15 |
| 8. | 140 වන වාර්ෂික මහා සභා රැස්වීම් වාර්තාව | 16-30 |
| 9. | 140 මහා සභාවට සාමාජිකයින් විසින් ඉදිරිපත් කරන ලද පෞද්ගලික යෝජනා සම්බන්ධයෙන් ලබා ගත් කළමනාකරණ කමිටු තීරණ සහ ක්‍රියා මාර්ග | 31-33 |
| 10. | 141 වන කළමනාකරණ වාර්තාව | 34-41 |
| 11. | 2024 .12.31 දිනට මූල්‍ය තත්ත්ව විස්තරය | 42 |
| 12. | 2024.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ආදායම් වියදම් ප්‍රකාශනය | 43 |
| 13. | 2024.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය | 44-45 |
| 14. | 2024.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය | 46 |
| 15. | 2024.12.31 දිනට මරණ ප්‍රදාන වෘද්ධි සංචිත අරමුදලේ ගිණුම් | 47 |
| 16. | 2024 ගිණුම් සඳහා වූ සටහන් | 48-58 |
| 17. | වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති අනාවරණය කිරීම | 58-59 |
| 18. | 2024 විගණකාධිපති වාර්තාව | 60-63 |
| 19. | 2024 වර්ෂයේ දී දැනුම් දී ඇති මිය ගිය සාමාජිකයින්ගේ නාම ලේඛනය | 64-66 |
| 20. | 139 වාර්ෂික මහා සභා රැස්වීමේ දී පත් කළ විශේෂ කමිටුව විසින් සකස් කරන ලද සහකාර බංගලා භාරකරු බඳවා ගැනීමේ පටිපාටිය | 67-72 |

**<u>රාජ්‍ය සේවා අනොන්‍යාන්‍ය අර්ථසාධක සංගමය.</u>**

**<u>141 වන වාර්ෂික මහා සභා රැස්වීම.</u>**

**2025.08.30 (සෙනසුරාදා) පෙ.ව.8.45 ට කොළඹ 7, රාජකීය විද්‍යාලීය නවරඟහලේදී ආරම්භ කරනු ලැබේ.**

<u>න්‍යාය පත්‍රය.</u>

| | | |
|---|---|---|
| **01.** | **පෙ.ව. 8.45** | **ජාතික කොඩිය එසවීම.** |
| **02.** | **පෙ.ව. 8.50** | **චිරාගත සම්ප්‍රදායානුකූලව පොල්තෙල් පහන දැල්වීම** |
| **03.** | **පෙ.ව. 9.00** | **රැස්වීම කැඳවීමේ නිවේදනය කියවීම.** |
| **04.** | **පෙ.ව. 9.05** | **මියගිය සාමාජිකයින් සහ දේශය වෙනුවෙන් දිවි පිදූ රණවිරුවන් සිහිකිරීම.** |
| **03.** | **පෙ.ව. 9.10** | **පිළිගැනීමේ කතාව සහ ප්‍රගති සමාලෝචනය (2024-2025) - ගරු සභාපති ආචාර්ය එච්.ඒ. නීල් සමන් කුමාර** |
| **04.** | **පෙ.ව. 9.20** | **ජ්‍යෙෂ්ඨතම සාමාජිකයින් 100 දෙනා සඳහා ජ්‍යෙෂ්ඨ සාමාජිකත්ව දීමනා ප්‍රදානය.** |
| **05.** | **පෙ.ව. 9.30** | **2023 වර්ෂයේ අ.පො.ස (උසස් පෙළ) ප්‍රතිඵල මත විශ්ව විද්‍යාල ප්‍රවේශය සඳහා තෝරා ගත් සාමාජික දරුවන් සඳහා මූල්‍යමය ආධාර.** |
| **06.** | **පෙ.ව. 9.45** | **නිල යෝජනා ඉදිරිපත් කිරීම හා සාකච්ඡා කිරීම.** |
| **07.** | **පෙ.ව. 10.30** | **2025/2026 නිළවරණය සඳහා නාම යෝජනා ඉදිරිපත් කර ඇති සාමාජික සාමාජිකාවන්ගේ ස්වයං හඳුන්වා දීම.** |
| **08.** | **පෙ.ව. 11.15** | **නාම යෝජනා මත 2025/2026 කළමනාකරණ කමිටුව සඳහා සාමාජික මහත්ම/මහත්මීන් 11 දෙනෙකු තෝරා පත් කර ගැනීමේ සාමාජික ඡන්දය පැවැත්වීම ආරම්භය.** |
| **09.** | **පෙ.ව. 11.30** | **2024.10.12 වන දින පවත්වන ලද 140 වන වාර්ෂික මහා සභා රැස්වීම් වාර්තාව සාකච්ඡා කිරීම හා සම්මත කිරීම.** |
| **10.** | **පෙ.ව. 11.55** | **2024.12.31 දිනෙන් අවසන් මූල්‍ය වර්ෂය සඳහා 141 වන කළමනාකරණ වාර්තාව සහ 2024 මූල්‍ය ප්‍රකාශන පිළිබඳව සාකච්ඡා කිරීම හා අනුමත කිරීම.** |
| **11.** | **ප.ව. 12.30** | **2024 වර්ෂය සඳහා සාමාජිකයින් වෙනුවෙන් ප්‍රකාශිත පොළිය සහ කාර්ය මණ්ඩලයට ප්‍රසාද දීමනා ගෙවීම පිළිබඳව සාකච්ඡා කිරීම හා අනුමත කිරීම.** |
| **12.** | **ප. ව. 12.45** | **පූර්ව වශයෙන් ඉදිරිපත් කර ඇති පෞද්ගලික යෝජනා සභාව හමුවේ ඉදිරිපත් කිරීම.** |
| **13.** | **ප.ව 6.30** | **සමාප්තිය.** |

රාජ්‍ය සේවා අනොන්‍යාන්‍ය අර්ථසාධක සංගමය
නො.155/5 කාසල් වීදිය,
කොළඹ 08.

එන්.ජේ.ඩබ්.වයි. නානායක්කාර
ඒකාබද්ධ ලේකම් හා භාණ්ඩාගාරික

## 2024 වර්ෂය සඳහා ජ්‍යෙෂ්ඨ සාමාජිකත්ව දීමනා හිමි නාම ලේඛණය

| අ.අ. | සා.අ. | නම | අ.අ. | සා.අ. | නම |
|---|---|---|---|---|---|
| 1 | 12415 | ටී. එම්. ඩී. නානායක්කාර මයා | 26 | 12490 | ජී.ඩී.සී. මෙන්ඩිස් මයා |
| 2 | 12421 | බී.පී. පෙරේරා මයා | 27 | 12496 | එම්.ඒ. කරුණාදාස මයා |
| 3 | 12422 | ඒ.ඩබ්ලිව්. මොහොට්ටාල මයා | 28 | 12502 | ඩී. අබේධීර මයා |
| 4 | 12423 | එම්.ජී.එච්. මුස්තාපා මයා | 29 | 12503 | කේ.කේ. දනපාල මයා |
| 5 | 12435 | ජී කරුණාසේන මයා | 30 | 12506 | එල්. ජේ. බී. සිල්වා මයා |
| 6 | 12437 | කේ.ඩබ්ලිව්.එස්. ගෞතමදාස මය | 31 | 12507 | ඩබ්ලිව්.එම්. වීරසිංහ මයා |
| 7 | 12438 | පී.එච්.කේ.එස්. දයාරත්න මයා | 32 | 12508 | එච්.පී.ඊ. ප්‍රනාන්දු මයා |
| 8 | 12439 | එච්.ඩී. ගුණසිංහ මයා | 33 | 12510 | ඊ. රාජවාසම් මයා |
| 9 | 12442 | එම්.එස්. ජයරත්න මයා | 34 | 12513 | එස්. හේවාගම මයා |
| 10 | 12448 | ටී.ජී. ආරියදාස මයා | 35 | 12519 | ඩී.ඩබ්ලිව්.ආර්.එම්. වීරකෝන් මයා |
| 11 | 12452 | එන්.කේ. විමලසේන මයා | 36 | 12527 | යූ. වීරකෝන් මයා |
| 12 | 12454 | එන්. සිවනාදන් මයා | 37 | 12528 | ඒ. උපසේන මයා |
| 13 | 12455 | ටී. නඩරාජා මයා | 38 | 12537 | කේ. විතාරණ මයා |
| 14 | 12459 | ඒ.ඒ. ජයරත්නම් මයා | 39 | 12538 | යූ. අලහකෝන් මයා |
| 15 | 12460 | සී.යූ.ඩබ්ලිව්. පළහසිංහ මයා | 40 | 12542 | කේ.එම්. ගුරුසිංහ මයා |
| 16 | 12469 | එච්.එස්.ආර්.ඒ. පෙරේරා මයා | 41 | 12549 | එම් පවලනාදන් මයා |
| 17 | 12472 | වී. සදගෝපන් මයා | 42 | 12556 | ඩබ්ලිව්.ඒ.ඩී. ඩයලස් මයා |
| 18 | 12474 | පී.ජී. විජිතසේන මයා | 43 | 12558 | අයි. වීරවර්ණ මයා |
| 19 | 12475 | ඩී අමරසේන මයා | 44 | 12563 | පී.ඩී. මහින්දරත්න මයා |
| 20 | 12476 | කේ.ඩී.එස්. සිරිවර්ධන **මයා** | 45 | 12564 | එස්.පී.තිලකරත්න මයා |
| 21 | 12477 | ටී. බාලසුබ්‍රමනියම් මයා | 46 | 12570 | ආර්. චන්ද්‍රසෝම මයා |
| 22 | 12481 | ඕ.එම්. වීරසූරිය මයා | 47 | 12574 | කේ.ඒ. අබේගුණවර්ධන මයා |
| 23 | 12483 | ඩබ්.ඩබ්.කේ.ඩබ්. මෙන්ඩිස් මයා | 48 | 12578 | ඩී.පී.එල්.සී. පෙරේරා මයා |
| 24 | 12485 | එම්.සී.එම්. ගුණසේකර මයා | 49 | 12580 | එල්.එච්.පී. ද සිල්වා මයා |
| 25 | 12487 | කේ.එස්. ගුණරත්නම් මයා | 50 | 12581 | එස්. ඒ. ගමගේ මයා |

2024 වර්ෂය සඳහා ජ්‍යෙෂ්ඨ සාමාජිකත්ව දීමනා හිමි නාම ලේඛණය

| අ.අ. | සා.අ. | නම | අ.අ. | සා.අ. | නම |
|---|---|---|---|---|---|
| 51 | 12586 | ඒ.ආර්. විජේසේන මයා | 76 | 12660 | ඩබ්ලිව්.ජී.ප්‍රේමරත්න මයා |
| 52 | 12590 | ජී.ඒ. වෙල්වරත්නම් මයා | 77 | 12670 | වී.පී.ජේ. එදිරිසිංහ මයා |
| 53 | 12591 | එස්.ඩබ්ලිව්. රාජපක්ෂ මයා | 78 | 12687 | ඩබ්. ආර්. එම්. සමරසේකර මයා |
| 54 | 12595 | ඩී.ජී. ආරියරත්න මයා | 79 | 12688 | ඒ. ආනන්දරාජා මයා |
| 55 | 12596 | එච්. කේ. නන්දදාස මයා | 80 | 12693 | එම්. ඒ. දයාරත්න මයා |
| 56 | 12605 | එම්. වන්නිආරච්චි මයා | 81 | 12696 | එස්.බී. බන්දුසේන මයා |
| 57 | 12608 | එම්.එම්. තිලකරත්න මයා | 82 | 12698 | එන්.සුන්දරම් මයා |
| 58 | 12610 | ජී. අතුකෝරල මයා | 83 | 12699 | කේ. කරුණාසේන මයා |
| 59 | 12613 | පී.ඩී. දයාවතී මිය | 84 | 12700 | පී.වී. චන්ද්‍රරත්න මයා |
| 60 | 12619 | කේ.එච්.ඒ. කීර්තිරත්න මයා | 85 | 12702 | එල්.එච්.පී.ඩී. ප්‍රනාන්දු මිය |
| 61 | 12626 | ඩී. එන්. එස්. මුණසිංහ මයා | 86 | 12705 | කේ.ඩී. බන්දුසේන මයා |
| 62 | 12630 | එම්.ඒ.චන්ද්‍රසේන මයා | 87 | 12706 | එන්.කේ. ලියනගේ මයා |
| 63 | 12635 | එච්.වී.පී.එල්. ද සිල්වා මයා | 88 | 12707 | කේ.එල්. ද සිල්වා මයා |
| 64 | 12636 | එස්.ආර්. ජයසේකර මයා | 89 | 12711 | ඩබ්ලිව්.ඒ.පියසිංහ මයා |
| 65 | 12640 | ඩී. කහඳවල මයා | 90 | 12715 | එච්.පී.ඒ. රණසිංහ මයා |
| 66 | 12641 | ඩී.පී. සිරිතුංග මයා | 91 | 12716 | පී. ජී. ආරියරත්න මයා |
| 67 | 12642 | ජී.එම්. ගමගේ මිය | 92 | 12720 | ඒ කරුණාරත්න මයා |
| 68 | 12643 | වී ජී ප්‍රේමසිරි මයා | 93 | 12722 | ඩී.කේ. ද සොයිසා මයා |
| 69 | 12644 | එච්.ඩබ්ලිව්. සුගතදාස මයා | 94 | 12724 | ඒ.පී.විජේසිංහ මයා |
| 70 | 12648 | යූ.එන්.නානායක්කාර මයා | 95 | 12728 | සී කාරියවසම් මිය |
| 71 | 12649 | පී.ඩී. වික්‍රමනායක මයා | 96 | 12743 | ඩබ් ආර් එම් ඒ ඩී පී එම් රණසිංහ මයා |
| 72 | 12650 | කේ.ඩී.එච්.පී. ද සිල්වා මයා | 97 | 12748 | එච්.ඩබ්. කරුණාදාස මයා |
| 73 | 12652 | කේ.ඩී. ප්‍රේමතිලක මයා | 98 | 12751 | එම්.කේ. නන්දසේන මයා |
| 74 | 12655 | ටී. බී. අහමඩ් මයා | 99 | 12756 | පී.ටී. ප්‍රතිරාජ මයා |
| 75 | 12656 | ජී. ද එස්. හැගොඩ මයා | 100 | 12758 | පී.කේ. පළඟසිංහ මයා |

**2023 අ.පො.ස (උසස් පෙළ) විභාගයෙන් උසස් ලෙස සමත් වූ සාමාජික දරුවන්ගේ සම්පූර්ණ පාඨමාලා කාලය වෙනුවෙන් ශිෂ්‍යත්ව ලාභීන් පිලිබඳ තොරතුරු**

| අ. අං. | සා. අංකය | සාමාජිකයාගේ නම | ශිෂ්‍යයාගේ නම | විෂය ධාරාව | Z-Score අගය |
|---|---|---|---|---|---|
| 1 | 20933 | පී.ජී පෙරේරා මිය | ටී.ඒ.එම් එන්. සදමාලි | වෛද්‍ය | 2.4448 |
| 2 | 26503 | කේ.එන් අල්මේදා මයා | එම්. බී. අල්මේදා | ඉංජිනේරු | 2.5844 |
| 3 | 25126 | ආර්.එම්.කේ.කේ රත්නමලල මිය | යූ. පී. මිහිසාරි | කළමනාකරණ | 2.1533 |
| 4 | 20565 | ඩබ්.ඒ.එන් රාජරත්න මයා | ඩබ්.ඒ.පී උමයංගනා | කලා | 2.1635 |
| 5 | 21972 | ඩබ්.ඒ.එස්.කේ ගුණවර්ධන මිය | ජී.ටී ඩී. ජේමරත්න | ඉංජිනේරු තාක්ෂණවේදය | 2.4017 |
| 6 | 24563 | ඩබ්.කේ.ආර් මංගලිකා මිය | කේ.එස්. පල්ලියගුරු (දිවයිනේ ප්‍රථම ස්ථානය ලබාගෙන ඇත) | ජෛව තාක්ෂණවේදය | 3.0687 |
| නීති විෂයධාරාව යටතේ කිසිදු අයදුම්කරුවෙකු ඉදිරිපත් වී නොමැත. | | | | | |

## නිල යෝජනා

**01).** රීති අංක 13 (ii) අනුව පවත්නා කොන්දේසි යටතේ වැටුප් ණය සීමාවන් පහත වගුවේ අංක 1 සිට 6 දක්වා සඳහන් පරිදි වැඩි කිරීමට යෝජනා කරමු.

| අනු අංක | සාමාජික කාලය | දායක මුදල් ප්‍රතිශතය | පවතින උපරිම ණය මුදල | යෝජිත මුදල |
|---|---|---|---|---|
| **1.** | **අවු.1 ට අඩු** | **2.5%** | **5,000.00** | **10,000.00** |
| | | **5% හෝ වැඩි** | **10,000.00** | **20,000.00** |
| **2.** | **අවු 1-3 අතර** | **2.5%** | **15,000.00** | **30,000.00** |
| | | **5% හෝ වැඩි** | **20,000.00** | **40,000.00** |
| **3.** | **අවු 3-5 අතර** | **2.5%** | **25,000.00** | **50,000.00** |
| | | **5% හෝ වැඩි** | **30,000.00** | **60,000.00** |
| **4.** | **අවු.5-7 අතර** | **2.5%** | **40,000.00** | **80,000.00** |
| | | **5% හෝ වැඩි** | **50,000.00** | **100,000.00** |
| **5.** | **අවු.7-12 අතර** | **2.5%** | **60,000.00** | **120,000.00** |
| | | **5% හෝ වැඩි** | **70,000.00** | **140,000.00** |
| **6.** | **අවු.12 ට වැඩි** | **2.5%** | **100,000.00** | **200,000.00** |
| | | **5% හෝ වැඩි** | **125,000.00** | **250,000.00** |

**02)** රීති අංක 13 (ඊ) අනුව සාමාජිකයෙකුගේ දරුවෙකු ඉපදී අවුරුද්දක් ඇතුළත එම දරුවාගේ උප්පැන්න සහතිකය හා සාමාජිකයාගේ විවාහ සහතිකය සංගමය වෙත ඉදිරිපත් කරනු ලැබුවහොත් වර්තමානයේ

ගෙවනු ලබන රු.7,500.00 ණය මුදල රු.100,000.00 දක්වා වැඩි කිරීමට යෝජනා කරමු. මෙම ණය මුදල මාසික වාරික 40 කින් අයකරනු ලැබිය යුතු අතර වාර්ෂික පොළිය 8%කි. මෙය 40% සීමාවෙන් ඉවත් කරමින් රීතිය සංශෝධනය කිරීමට යෝජනා කරමු.

**03)** රීති අංක 13 (ඌ) යටතේ වසර දෙකකට වැඩි සාමාජිකත්වයක් ඇති සාමාජිකයින්ට ඔවුන්ගේ කලත්‍රයාට හෝ අවිවාහක දරුවන්ට ඇස් කණ්නාඩි මිලදී ගැනීම සඳහා වසර පහකට වරක් ගෙවනු ලබන රු.5,000.00 ක ණය මුදල රු.25,000.00ක උපරිමයක් දක්වා 10% පොළී ප්‍රතිශතය මත වාරික 36 කින් ආපසු ගෙවිය යුතු ලෙස සංශෝධනය කිරීමට යෝජනා කරමු. මෙම ණය මුදල වසර තුනකට වරක් සාමාජිකයන්ට 40% සීමාව යටතේ ලබා ගත හැකි අතර ප්‍රදානමික සාමාජිකයන්ට ද මෙම ණය මුදල ලබා ගත හැකි බවට යෝජනා කරමු.

**04)** රීති අංක 13 (ඔ) (ii) යටතේ සාමාජිකයින්ට පරිගණකයක් මිලදී ගැනීම සඳහා වාර්ෂික පොලිය 10% බැගින් අනුගාමී මාසික වාරික 50 කින් අය කරනු ලබන රු.75,000.00 ණය මුදල එම පොලිය යටතේ ම මාසික වාරික 40කින් අය කරනු ලබන රු.100,000.00 ණය මුදලක් ලෙස සංශෝධනය කිරීමට යෝජනා කරමු. මෙම ණය මුදල 40% සීමාවෙන් ඉවත් කිරීමට ද යෝජනා කරමු.

**05)** සාමාජිකයින් සඳහා දැනට ගෙවනු ලබන රු.10,000.00 ක් වූ ජංගම දුරකතනයක් මිලදී ගැනීම සඳහා වන ණය මුදල පවත්නා කොන්දේසි වලට අනුකූලව වාර්ෂික පොලිය 10% බැගින් අනුගාමී මාසික වාරික 25 කින් අය වන සේ රු.40,000 ක් දක්වා වැඩි කරමින් අංක 13 (ඔ) (vi) ලෙස නව රීතියක් ඇතුලත් කිරීමට යෝජනා කරමු.

**06)**. රීති අංක 13 (අ) යටතේ පවත්නා කොන්දේසි අනුව මරණ ප්‍රදාන ණය මුදල පොලි රහිත රු.15,000.00 සිට රු.50,000.00 දක්වා වැඩි කිරිම හා රීති අංක 13 (අ) (ii) යටතේ පවත්නා කොන්දේසි අනුව ගෙවන පොළී සහිත ණය මුදල රු.50,000.00 සිට රු.100,000.00 දක්වා වැඩි කිරිමට යෝජනා කරමු.

**07)** I. රීති අංක 14 (3) i , ii , iii ඡේදවල අවශ්‍යතා සම්පූර්ණ කර අවු. **5ට වැඩි සාමාජික කාලයක් සහිත සාමාජිකයෙකු සඳහා** වෛද්‍යාධාර ඉල්ලුම්පතේ සඳහන් **දරුණු රෝගයකින් පෙලෙන අවස්ථාවක දී** ගෙවන රු.50,000.00 ක මුදල රු.100,000.00 දක්වා වැඩි කිරීමටත් අක්ෂි සැත්කම් සඳහා එක් ඇසකට රු.10,000.00 බැගින් ගෙවනු ලබන මුදල එක් ඇසකට රු.15,000.00 දක්වා වැඩි කිරීමටත් වෛද්‍යාධාර අරමුදල සඳහා දැනට මාසිකව අයකරනු ලබන රු 50 ක මුදල එලෙසම පවත්වා ගැනීමටත් යෝජනා කරමු.

හෝ,

II. දැනට වෛද්‍යාධාර අරමුදල සඳහා මාසිකව අයකරනු ලබන රු.50.00ක මුදල වෙනුවට රු.75 ක මුදලක් අයකර පවතින කොන්දේසි මත ගෙවනු ලබන වෛද්‍යාධාර මුදල රු.50,000.00 සිට රු.150,000.00 දක්වා වැඩි කිරීමටත් අක්ෂි සැත්කම් සඳහා එක් ඇසකට රු.20,000.00 බැගින් ඇස් දෙකට රු.40,000.00 ක වෛද්‍යාධාර මුදලක් ගෙවීමටත් යෝජනා කරමු.

**08)** සංගම් ව්‍යවස්ථාවේ 2 පරිච්ඡේදයේ 1(II) රීතිය යටතේ සඳහන් වන පරිදි "ඉඩකඩම් ඇප වශයෙන් තබා ගෙන පාලන කමිටුවට මෙසේ ආයෝජනය කිරීමට පුළුවන් මුදල් ප්‍රමාණය යම් දිනකදී එබඳු ආයෝජනයන්ගේ මුල් මුදල් වලින් අයවිය යුතුව තිබෙන ප්‍රමාණවල එකතුව සංගමයේ ශුද්ධ වත්කම් වලින් හතරෙන් තුනකට වැඩි නොවන පරිද්දෙන් පාලනය කළ යුතුය" යන රීතියට යටත්ව
"රාජ්‍ය සේවා අන්‍යොන්‍ය අර්ථ සාධක සංගමයේ වසර 03 ක සාමාජිකත්වයක් හිමි සාමාජිකයෙකුට පවත්නා කොන්දේසි යටතේ ම දැනට ගෙවනු ලබන රු.1,500,000.00 දේපළ ණය මුදල රු.2,500,000.00 දේපළ ණය මුදලක් ලෙස වැඩි කර 10% ක පොළී අනුපාතයක් යටතේ ලබා ගත හැකිය" යනුවෙන් 1 (II) (ඌ) යනුවෙන් නව රීතියක් ඇතුළත් කිරීමට යෝජනා කරමු.

**09)** රාජ්‍ය සේවා අන්‍යොන්‍ය අර්ථසාධක සංගම් ව්‍යවස්ථාවේ iii පරිච්ඡේදයේ (2) රීතිය පරිදි අපොස උ.පෙළ විභාගයේ ප්‍රතිඵල මත විශ්ව විද්‍යාල ප්‍රවේශය සඳහා තෝරා ගන්නා ලද සාමාජිකයින්ගේ දරුවන් වෙත දැනට කෙරෙන මූල්‍යමය උපකාරය "ආධාර" ලෙස සඳහන් කර තිබීම "මූල්‍යමය ප්‍රදානයක්" ලෙස සඳහන් කිරීමටත්, ඒ ඒ විෂය ධාරාවන් යටතේ වැඩිම "**Z** අගයක්" ("Z" score) ලබා ගනිමින් විශ්ව විද්‍යාල ප්‍රවේශය සඳහා තේරී පත් වූ සාමාජිකයින්ගේ දරුවන් හට අදාල කාලසීමාව සඳහා අඛණ්ඩව ලබා දෙනු ලබන මාසික මූල්‍යමය

ප්‍රදානය රු.1,000.00 සිට රු.2,500.00 දක්වා වැඩි කරමින් (2) රීතිය සංශෝධනය කිරීමටත් (9) රීතියේ සඳහන් ව ඇති පරිදි එක් වරක් පමණක් ලබා දෙන මූල්‍යමය ප්‍රදානය රු.3,000.00 සිට රු.5,000.00 දක්වා වැඩි කරමින් (9) රීතිය සංශෝධනය කිරීමටත් යෝජනා කරමු.

**10)** රාජ්‍ය සේවා අන්‍යෝන්‍යාධාර අර්ථසාධක සංගමයේ 2024 වර්ෂයේ දී ගෙවීම් පැහැර හරින්නන් 900 ක් පමණ වාර්තා වී ඇති අතර සංගමයට අයවිය යුතු මුදල් ප්‍රමාණය සාමාන්‍යයෙන් මසකට රු.මිලියන තුනක් පමණ වන බව අනාවරණය වී ඇත. මෙම මුදල් අය කිරීමට දැනට සංගමය මගින් වැඩ පිළිවෙලක් ක්‍රියාත්මක කළද සංගමයට අය විය යුතු මුදල් අයකර ගැනීම වඩාත් කාර්යක්ෂම කර ගැනීම සඳහා එකතු කරන මුදලින් යම් ප්‍රතිශතයක් ද ලබා දීමේ පදනම මත ණය අය කර ගැනීමේ ආයතනයක සේවය ලබා ගැනීමට යෝජනා කරමු.

**11)** රාජ්‍ය සේවා අන්‍යෝන්‍යාධාර අර්ථසාධක සංගමයේ කාර්යමණ්ඩලයේ පළපුරුදු සේවකයින්ගේ සේවය තවදුරටත් ලබා ගැනීම හා රජයේ සේවකයන්ගේ ද විශ්‍රාම ගැන්වීමේ වයස අවු.60 වන බැවින් රාජ්‍ය සේවා අන්‍යෝන්‍යාධාර අර්ථසාධක සංගම් කාර්යමණ්ඩලයේ විශ්‍රාම ගැන්වීමේ වයස් සීමාවද අවු. 57 වෙනුවට විශ්‍රාම ගැනීමේ වයස් සීමාව අවු.60 දක්වා වසරින් වසර (කාර්ය සාධනය මත) දීර්ඝ කිරීම සුදුසු යැයි යෝජනා කරමු.

**12)** දැනට සංගමයේ පවතින අතිශය සංකීර්ණ සහ පුළුල් ගිණුම් ක්‍රියාවලිය සහ වත්කම් ප්‍රමාණයත්, දිනෙන් දින වැඩිවන මෙහෙයුම් ප්‍රමාණයත්, සැලකීමේ දී ගණකාධිකාරි තනතුරෙහි වගකීම පුළුල් වී ඇති හෙයින් මෙහෙයුම් කාර්යක්ෂමතාවය හා නිරවද්‍යතාවය තහවුරු කිරීම මෙන්ම සාමාජිකත්වයට වගවීම පිළිබඳව අවධානය යොමු කර එම තනතුරට අමතරව සහකාර ගණකාධිකාරි සහ අභ්‍යන්තර විගණක වශයෙන් නව තනතුරු දෙකක් ඇති කිරීම සුදුසු බව යෝජනා කරමු.

**13)** පවත්නා වෙළඳපොල අවශ්‍යතා සහ පොළී අනුපාත සැලකිල්ලට ගනිමින් සාමාජිකයින්ට ගෙවනු ලබන ණය ප්‍රමාණ පොළී අනුපාත සහ වාරික සංඛ්‍යාව භාණ්ඩාගාර නියෝජ්‍ය ලේකම්ගේ එකඟතාවයට යටත්ව කළමනාකරණ කමිටුව විසින් සංශෝධනය කිරීමේ වර්තමාන ක්‍රමවේදය තුල භාණ්ඩාගාරයේ එකඟතාවය ලබා ගැනීමට ප්‍රායෝගික වශයෙන් ගතවන අධික කාලය තුල සාමාජිකයින්ට වන අපහසුතාවය පිළිබඳව සැලකිල්ලට ගනිමින් , "වාර්ෂික මහා සභාවේ ආවරණ අනුමැතියට යටත්ව රජයේ සහ වෙළෙඳපොළේ උච්චාවචනය වන පොළී අනුපාත සැලකිල්ලට ගෙන සංගමය ලබා දෙන ණය , පොළිය හා ආපසු අය කරන වාරික සංඛ්‍යාව නිසි අධ්‍යයනයකින් අනතුරුව සංශෝධනය කිරීමේ බලය කළමනාකරණ කමිටුවට ඇත." යනුවෙන් 17(iii) රීතිය සංශෝධනය කිරීමට යෝජනා කරමු.

**14)** සංගමයේ විශ්‍රාමික සාමාජිකයින් හට ගෙවනු ලබන වැටුප් ණය ප්‍රමාණය වැඩි කිරීම සඳහා,
13 (ii) (ඇ) රීතියට පසුව,

" තවද වයස අවු.70 ට අඩු විශ්‍රාමික සාමාජිකයින් හට සාමාජිකයාගේ මූලික විශ්‍රාම වැටුප මෙන් 18 ගුණයක සීමාව ඇතුලත ණය මුදල් ලබා ගත හැකිය. "යනුවෙන් 13 (ii) (ඉ) ලෙස නව රීතියක් ඇතුලත් කිරීමට යෝජනා කරමු.

**15)** දිරිය ණය ලබා ගෙන ඇති විශ්‍රාමික සාමාජිකයින්ට ණය ලබා දීමේ දී එම ණය සීමාවට දිරිය ණය ශේෂය ද ඇතුලත් කර ගණනය කරන හෙයින් විශ්‍රාමික සාමාජිකයින් හට ලබා ගැනීමට හැකි ණය මුදල් සීමා වීම හේතුවෙන් සිදුවන අපහසුතාවය පිළිබඳ සලකා බලා ,

"දිරිය ණය ලබා ගත් විශ්‍රාමික සාමාජිකයින් අනෙකුත් සාමාන්‍ය ණය ලබා ගැනීමේ දී විශ්‍රාම වැටුප් මෙන් දොළොස් ගුණයක් / දහඅට ගුණයක් යන සීමාවට ණය ගණනය කිරීමේ දී දිරිය ණය මුදල ඇතුලත් කරනු නොලැබේ" යනුවෙන් නව රීතියක් 13 (කා) (i) ලෙස ඇතුලත් කිරීමට යෝජනා කරමු.

**16)** කළමනාකරණ කමිටුවට සභිකයින් තෝරාපත් කර ගැනීමේ නිලවරණයේ දී අපේක්ෂකයින් වශයෙන් ඉදිරිපත් වන අය හට අපේක්ෂක අංක නිකුත් කිරීමේ දි වරින් වර ඉංග්‍රීසි අකාරාදි ක්‍රමය සහ සිංහල අකාරාදි ක්‍රමය උපයෝගි කරගෙන ඇති බව නිරීක්ෂණය වන අතර 139 වාර්ෂික මහා සභා වාරයේ පටන් (මැතිවරණ දෙපාර්තමේන්තුවෙන් විමසා) සිංහල අකාරාදි ක්‍රමය අනුගමනය කරනු ලබයි. ඉදිරියේ දී මේ සඳහා කිනම් ක්‍රමවේදයක් ස්ථිරව උපයෝගී කරගත යුතු ද යන්න පිළිබඳව මහා සභාවෙන් විමසා බහුතර එකඟතාවය මත ස්ථිර ක්‍රමවේදයක් නිශ්චය කර ගැනීම සඳහා යෝජනාවක් ඉදිරිපත් කරමු.

**17)** පහත සඳහන් තොරතුරු වලට අනුව මෑත වර්ෂවල සංගමයේ සාමාජිකත්ව වර්ධන වේගයේ අඩුවක් පවතින බව පෙනී යයි.

| වර්ෂය | වසර ආරම්භක සාමාජිකත්වය | බඳවා ගැනීම් | ඉවත් වීම් | වසර අවසාන සාමාජිකත්වය | වර්ධන වේගය |
|---|---|---|---|---|---|
| 2018 | 13,377 | 677 | 315 | 13,739 | |
| 2019 | 13,739 | 865 | 297 | 14,307 | 4.13% |
| 2020 | 14,307 | 292 | 194 | 14,405 | 0.68% |
| 2021 | 14,405 | 374 | 299 | 14,480 | 0.52% |
| 2022 | 14,480 | 1014 | 351 | 15,143 | 4.6% |
| 2023 | 15,143 | 749 | 462 | 15,430 | 1.8% |
| 2024 | 15,430 | 525 | 416 | 15,539 | 0.7% |

රජයේ වැටුප් වැඩි වීම මත නව සාමාජිකයින් වැඩි පිරිසක් රාජ්‍ය සේවා අන්‍යෝන්‍යාධාර අර්ථසාධක සංගමයට බඳවා ගැනීම තුලින් සාමාජිකයින්ට වැඩි ප්‍රතිලාභයක් ලබා දීමට ඇති හැකියාව මෙන්ම සංගමයේ අඛණ්ඩ පැවැත්ම උදෙසා නව තරුණ සාමාජිකත්ව පදනමක අවශ්‍යතාවය පිලිබඳව සලකා බලා නව සාමාජිකයෙකු හඳුන්වා දෙනු ලබන සාමාජිකයාට වර්තමානයේ දී ගෙවනු ලබන රු.100.00 ක මුදල වෙනුවට පහත කොන්දේසියට යටත්ව සංගමයේ අරමුදලින් රු.500.00 ක දිරි දීමනාවක් ගෙවීමට යෝජනා කරමු.

" සාමාජික ප්‍රවර්ධනය පිණිස නව සාමාජිකයින් හඳුන්වා දීම වෙනුවෙන් හඳුන්වා දෙනු ලබන සාමාජිකයාට රු.500.00 ක දිරි දීමනාවක් ඔහුගේ කැමැත්ත අනුව අර්ධ වාර්ෂිකව මුදලින් හෝ ගිණුමට ගෙවීම" යනුවෙන් 30 රීතිය සංශෝධනය කිරීමට යෝජනා කරමු. මේ සඳහා අවම වශයෙන් නව සාමාජිකයින් තිදෙනෙකු හඳුන්වා දිය යුතු අතර ඔවුන්ගෙන් සාමාජික මුදල් අවම වශයෙන් මාස 03ක් අයවිය යුතුය.

18) "මහා සභාවට ඉදිරිපත් කිරීම සඳහා යොමු කරනු ලබන පෞද්ගලික යෝජනා පරීක්ෂා කොට ඒවායින් සංගමයේ අභිවෘද්ධියට සහ පොදු සාමාජික යහපතට හේතුවන යෝජනා පමණක් මහ සභාවට ඉදිරිපත් කිරීමටත්, පුද්ගල ප්‍රතිරූපයන්ට පටහැනිව ඉදිරිපත් වන සහ සංගමයේ කීර්තිනාමයට හානියක් වන සහ සංගම් ආඥා පනතට පටහැනිව ඉදිරිපත් කර ඇති යෝජනා පිළිබඳව තීරණ ගැනීමේ බලය කළමනාකරණ කමිටුව සතුය. අවශ්‍ය නම් යෝජනාව ඉදිරිපත් කරන ලද සාමාජිකයාට තම සම්පූර්ණ යෝජනාව මහ සභාවේ දී ඉදිරිපත් කළ හැකිය". යනුවෙන් රාජ්‍ය සේවා අන්‍යෝන්‍යාධාර අර්ථසාධක සංගම් ව්‍යවස්ථාවේ I වන පරිච්ඡේදයේ රීති අංක 33ට පසුව 34 ලෙස නව රීතියක් වශයෙන් ඇතුළත් කිරීමට යෝජනා කරමු.

## පෞද්ගලික යෝජනා

**(1) වි.පුබාලසිංහම් මයා (සාමාජික අංක - 12929)**

1. දැනට ගෙවනු ලබන රු.5,000/- ක ජ්‍යෙෂ්ඨ සාමාජිකත්ව දීමනාව රු.10,000/- ක් දක්වා වැඩි කරන මෙන් යෝජනා කරමි.
2. ජ්‍යෙෂ්ඨ සාමාජිකත්ව දීමනාව වසරකට සාමාජිකයින් 100 දෙනෙකුට පමණක් ගෙවනු ලබන හෙයින් එය 200 දෙනෙකුට ගෙවීමට යෝජනා කරමි.
3. දායක මුදල් ණය, වැටුප් ණය සඳහා වූ පොලිය 8% සිට 6% දක්වා අඩු කරන මෙන් යෝජනා කරමි.

**(2) _සුබෝධා එස් .ජයතිලක මිය. (සාමාජික අංකය -25601)**

1. දැනට අකර්මණ්‍ය වී ඇති දිරිය ණය යෝජනා ක්‍රමය විධිමත් පරිදි පවත්වා ගෙන යා යුතු බව යෝජනා කරමි.
2. දැනටමත් දිරිය ණය ලබාගෙන ඇති සාමාජිකයින් හට එම ණය මුදලින් අවකරණය වී ඇති කොටස නැවත ලබා ගැනීමට අවස්ථාව සලසා දෙන ලෙස යෝජනා කරමි.
3. දිරිය ණය යෝජනා ක්‍රමය ණය සුරැකුම් රක්ෂණාවරණයක් මගින් ආවරණය වන්නක් වන හෙයින් විශ්‍රාමික සාමාජික මහත්ම මහත්මින්ගේ සාමාන්‍ය ණය සීමාව නොසලකා මෙම ණය යෝජනා ක්‍රමය යටතේ ණය ලබා දෙන ලෙස යෝජනා කරමි.

**(3) එච්.එස්.පී.ද සොයිසා මිය. (සාමාජික අංකය - 23480)**

1. ඉදිරියේ දී පැවැත්වීමට නියමිත මහ සභා නිලවරණවලදී දුරස්ථ රජයේ හා රජයේ විශ්‍රාමික නිලධාරී මහත්ම මහත්මීන්ට තැපැලෙන් ඡන්දය දැමීමට සුදුසු ක්‍රමවේදයක් සකස් කරන ලෙසට යෝජනා කරමි.
2. සංගම් රීති මාලාවෙ 17 වන රීතියේ (2018.03.06 අතිවිශේෂ ගැසට් පත්‍රය) iii ඡේදය එනම්, "භාණ්ඩාගාර නියෝජිත ලේකම්වරයාගේ එකඟත්වයට යටත්ව රජයේ සහ වෙලඳපොලේ උච්චාවචනය වන පොලී අනුපාතය සැලකිල්ලට ගෙන සංගමයට ලබා දෙන ණය සහ පොලිය සංශෝධනය කිරීමේ බලය පාලන කමිටුවට ඇත" යන රීතියේ "ණය සීමාව වැඩි කිරීමේ බලය මින්මතුව මහා සභාවේ අනුමැතියට යටත්ව සිදු කල යුතුය."යන්න සම්මත කර ගන්නා ලෙස ගෞරවනිය මහා සාමාජිකත්වය වෙත යෝජනා කරමි.
3. 2007.01.05 දිනෙන් පසුව අප සංගමයේ ව්‍යවස්ථාවෙහි සංශෝධිත රීති ඇතුලත් කර රීති මාලාව නිකුත් කර නොමැත. එබැවින් 2007.01.05 දිනෙන් පසුව සියළු සංශෝධිත රීති ඇතුලත් කර සංශෝධිත ව්‍යවස්ථාවක් සකස් කිරීමටත් එසේ සකස් කර ගත් සංශෝධිත ව්‍යවස්ථාව මුද්‍රණය කිරීමට ප්‍රමාද වන්නේ නම් එය මුද්‍රණය කරන තෙක් අපගේ සංගමයේ වෙබ් අඩවියට මුදා හැරීම පමණක් වත් කඩිනමින් සිදු කිරීමට යෝජනා කරමි.

(4) **ඒ.එල්.නලන්ත මයා. (සාමාජික අංකය - 31156)**

1. අප සංගමයේ විගණනය සිදු කර නිකුත් කරන වාර්තාව පාර්ලිමේන්තුවේ COPA කමිටුවක (රා.ව්‍යා.කමිටුවේ) ප්‍රශ්න කිරීමේ ක්‍රියාවලියක් සිදු නොවන බැවින් ඉදිරියේදී එවැනි ක්‍රියාමාර්ගයක් ගැනීමට විගණකාධිපතිවරයා සමග සාකච්ඡාවක් පැවැත්වීමට අවශ්‍ය කටයුතු යොදන ලෙස යෝජනා කරමි.
2. කාර්යය සාධන විගණනයක් සිදු කිරීම සහ කාර්තුවකට වාරයක් එනම් මාස 04 කට වරක් බැගින් තෙවරක් විගණනය කර වාර්ෂික වාර්තාව මහා සභාවට ඉදිරිපත් කරන ලෙස යෝජනා කරමි. (දැනට ඉදිරිපත් කරන්නේ වසරකට එක් වරක් පමණි.)
3. වාර්ෂික මහා සභාවට විගණකාධිපතිගේ නියෝජිතයින් කැඳවන ලෙසත් ගැටළු පිලිබඳව ප්‍රශ්න කිරීමට මහා සාමාජිකත්වයට ඉඩ ලබා දෙන ලෙසත් යෝජනා කරමි.
4. වසර 140 ක් පවත්වා ගෙන ආ පිලිවෙල අනුව 141 වාර්ෂික සභාව පැවැත්වීමට කටයුතු කරන ලෙස යෝජනා කරමි. න්‍යාය පත්‍රය අනුව ප්‍රමුඛව කල යුතු කටයුතු වන ගිණුම් ප්‍රකාශ සම්මත කර ගැනීම, කළමනාකරණ වාර්තාව ඉදිරිපත් කිරීම, විගණන වාර්තාව ඉදිරිපත් කිරීම වැනි කටයුතු වලට ප්‍රමුඛත්වය ලබා දී නිලවරණය අවසානයේ දී පැවැත්විය යුතු බව යෝජනා කරමි.

**(5) ඩබ්.ඒ.එල්.එච්. වැලිවිට මයා. (සාමාජික අංකය - 18959)**

1. වසර 139ක් පුරාවට සංගමය විසින් පවත්වා ගෙන ආ පරිදි නිලවරණ අපේක්ෂක අංක ලබා දීමේ ඉංග්‍රිසි අක්ෂර ක්‍රමවේදය තවදුරටත් පවත්වා ගෙන යාම සහ ඉංග්‍රිසි අක්ෂර අනුපිලිවෙලට අංක ලබා දීම නිතී ගත කිරීමට යෝජනා කරමි.
2. 2010.07.24 වන දින මහා සභා රැස්වීමේ දී ඒකමතිකව අනුමත කර ඇති සංගමයේ කාර්යය පටිපාටි සංග්‍රහයේ පළමුවන පරිච්ඡේදයේ පනවා ඇති රීතිය වන සියළු බඳවා ගැනීම් උසස් වීම් මහා සභාවේ අනුමැතියට යටත්ව සිදු කල යුතු නමුත් මහා සභාවේ අනුමැතියකින් තොරව 2011 වර්ෂයේ දී අධිශ්‍රේණියේ මුල්‍ය කළමනාකරු, 2017 වර්ෂයේ දී කලමනාකරණ කමිටුවක් ගත් තීරණයක් මත සහකාර ගණකාධිකාරී තනතුර, 2017 වර්ෂයේදී ම 2016 වර්ෂය පෙරදාතම් කර ගණකාධිකාරී තනතුර ලබා දීම යන නීතිවිරෝධි ක්‍රියාවන් සම්බන්ධයෙන් පිලිගත් බාහිර විමර්ශන කමිටුවක් (රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය) මඟින් විමර්ශනයක් සිදු කිරීමට යෝජනා කරමි.
3. 1996 අංක 13 සංශෝධන පනතට පහත සඳහන් පැහැදිලි කිරීම එකතු කරන ලෙස යෝජනා කරමි.

   "2: (ඇ) මෙම වගන්තියේ දැක්වෙන සංස්ථාවේ කිසිම සාමාජිකයෙකු යන්නට භාණ්ඩාගාර ලේකම් විසින් පත් කරන සභාපති නම් කල කමිටු සාමාජික දෙදෙනාද ඇතුලත් විය යුතුය, එසේම ඒ අය එක් වරකට වඩා එම තනතුර දැරීමට නුසුදුසු වන්නේය."

**(6) ඩී.එම්.දයානි දිසානායක මිය. (සා.අංක - 16767)**

**<u>යෝජනා අංක 01 :-</u>**

සංගම් ආඥා පනත අනුව කාර්ය මණ්ඩලයේ විධායක නිලධාරීන් දෙදෙනෙකි. රාජ්‍ය සේවයෙන් ද්විතියීක පදනම මත මුදා හරින ලේකම් හා භාණ්ඩාගාරික සහ සහකාර ලේකම් යන දෙදෙනාය. පරිපාලන අංශය සහකාර ලේකම් ද, ගිණුම් කටයුතු සංගමයේ ජ්‍යෙෂ්ඨ අයෙකු වන මුදල් සහකාර විසින් ද ඉටු කරමින් ලේකම් වරයාට සහය වීම දීර්ඝකාලීනව සිදු කර ඇත.

පනත ප්‍රකාර ලේකම් හා භාණ්ඩාගාරික තනතුර ඇති කර ඇත්තේ ගණකාධිකාරී තනතුරකට සමානවය. දීර්ඝකාලයක් පවත්වා ගෙන ආ එම ක්‍රමවේදය තුල වර්තමානයේ මෙන් ගැටලු ඇති නොවීය. සංගමයේ නව තනතුරු ඇති කිරීම 2010.07.24 දින මහ සභාවේදී පනවා සම්මත කළ කාර්යපටිපාටි සංග්‍රහයේ රීති වලට අනුගතව පාලන කමිටුව ක්‍රියා කළ යුතුය. ඒ අනුව නව තනතුර හා අදාල බඳවා ගැනීමේ පටිපාටිය සඳහා වාර්ෂිකව මහ සභාවේ අනුමැතිය ලබා ගත යුතු වේ.

නමුත් එම බලය අභිබවා කටයුතු කළ පාලන කමිටුවක් විසින් 2011.07.10 රැස් වී තීරණයක් ගෙන 2011.08.01 සිට සහකාර ගණකාධිකාරී තනතුරට අයෙකු බඳවා ගෙන ඇත. 2017.10.26 රැස් වුන කමිටුවක් එම පත්වීම " ගණකාධිකාරී " ලෙස උසස් කොට 2016.08.01 දින සිට බලපැවැත්වෙන පරිදි පෙරදාතම් කර හිඟ වැටුප් ගෙවා ඇති බවද දැන ගන්නට ඇත. රාජ්‍ය සේවයේ හෝ පුද්ගලික අංශයේ හෝ උසස් වීමක් ලබා දීමට උපයෝගී කර ගන්නා ක්‍රමවේද සාධක කිසිවක් අනුගමනය කර නැත. විශේෂම කරුණ වන්නේ පත්වීම ලබා දීමට උසස් වීම හා පෙරදාතම් කිරීමට එම වකවානු තුල කටයුතු කර ඇති කළමනාකරණ කමිටුව බහුතරයක් එකම පිරිසක් වීමයි. ඥාති සම්බන්ධතාවයක් ගැන ද තොරතුරු ලැබී ඇත.

2012.12.31 දින විගණන වාර්තාවේ කාර්යපටිපාටි සංග්‍රහයට හා සාප්පු හා කාර්යාල පනතට අනුගත නොවී කටයුතු නොකිරීම පිළිබඳ විගණක විසින් ද ප්‍රශ්නයක් මතු කර ඇත.

මෙම තනතුරට හිමි නොවන නොයෙකුත් දීමනා, වරප්‍රසාද , වැටුප් වැඩි වීම් , විටෙක රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ ද , විටෙක රාජ්‍ය කළමනාකරණ චක්‍රලේඛ ද , අනුව ගෙවමින් පවතී. එම දීමනා අනෙකුත් සේවකයින්ට ගෙවන්නේ නැත. මෙලෙස පාලන කමිටුවේ ඇතැම් සාමාජිකයින්ගේ වරදාන මත තවදුරටත් ක්‍රමවේද ප්‍රතිපත්ති වලින් බැහැරව මෙවැනි " සුදු අලියෙක් " නඩත්තු කිරීමට සංගමයට හැකියාවක් නැත. අවශ්‍ය වන්නේ නම් කාර්යපටිපාටියට අනුගතව සිදු කළ යුතුය. මෙම ගණකාධිකාරී තනතුරෙහි පහත සඳහන් විෂමතාවයන් පවතී.

1) ආඥා පනත , නීතිරීති උල්ලංඝනය කිරීම.
2) පාලන කමිටුවට බලයක් නොමැතිව නව තනතුර ඇති කිරීම, බඳවා ගැනීම, වැටුප් තීරණය කිරීම.
3) බඳවා ගැනීමේ පටිපාටියක් සකස් නොකර බඳවා ගැනීම.
4) කාර්යාලයේ අවශ්‍යතාවයන්ට හා සංවිධාන ව්‍යුහයට නොගැලපීම.
5) වැටුප් විෂමතාවයක් ඇති කිරීම උදා:- මුදල් අමාත්‍ය ලේකම්වරයාගේ නියෝජිතයින් වන්නේ පනත ප්‍රකාර ශ්‍රී ලංකා පරිපාලන සේවය හා ඊට සමාන නිලධාරීන්ගේ (3/ 2016 අනුව) තනතුරෙහි ආරම්භක වැටුප 47,615/- කි. සංගමයේ ගණකාධිකාරිගේ ආරම්භක වැටුප 53,175/- කි.
6) සංගම් ප්‍රධාන විධායක ලේකම් හා භාණ්ඩාගාරිකගේ වැටුප (3/2016) අනුව 47,615/- කි. (ශ්‍රී.ල.ප.සේ) හෝ 41580 /- කි. (කළ.ස.අධි.ශ්‍රේණි) එනයින් සංවිධාන ව්‍යුහයේ සේවා මට්ටම් සැලකිල්ලට ගෙන නැත.
7) සේවක අතෘප්තියක් නිර්මාණය කර ඇත.

කරුණු එසේ හෙයින් පහත සඳහන් යෝජනා සභා සම්මත කර ගන්නා මෙන් ඉල්ලා සිටිමි.

1) මේ සම්බන්ධයෙන් පූර්ණ විමර්ශනයක් පාලන කමිටුවෙන් බැහැර පුද්ගලයන්ගෙන් සමන්විත කමිටුවක් මඟින් සිදු කිරීම.
2) මහා සභාවේ අනුමැතියකට යටත් කොට එම කමිටු නිර්දේශ ක්‍රියාත්මක කිරීම. එතෙක් මෙම තනතුරට අසීමාන්තිකව ගෙවන වැටුප් වැඩි වීම් දීමනා සහ වරදාන නැවැත්වීම.
3) නීති රීති උල්ලංඝණය කළ පාලන කමිටු සාමාජිකයින් ට එරෙහිව නීතිමය ක්‍රියාමාර්ග ගැනීම.
4) ඉහත කටයුතු ඉටු කිරීමට නව කළමනාකරණ කමිටුවකට අද දින මහ සභාවෙන් බලය පවරා දීම.

**<u>යෝජනා අංක 02 :-</u>**

"සංගමයේ වත්කම් අවභාවිතයක් සම්බන්ධයෙන් හෝ කූටලේඛන සකස් කිරීමේ වරදකට චෝදනාවක් ලැබීමකට හෝ රාජ්‍ය නිලධාරියෙකු ලෙස කටයුතු කිරීමේ දී සිදු කරන ලද වැරදි ක්‍රියාවකට හෝ චෝදනා ලැබ වැරදිකරුවෙකු වී දඩුවමක් ලද අයෙකු කළමනාකරණ කමිටුවේ ධූර දැරීමට නුසුදුස්සෙකු වන්නේය" යන යෝජනාව සම්මත කර ගන්නා මෙන් ඉල්ලමි.

**(7) එච්.එම්.එච්.බී.හේරත් මයා. (සාමාජික අංකය - 17085)**

1. මින් මතු සංගමයේ නිලවරණ අපේක්ෂක අංක ලබා දීම ඉංග්‍රීසි අක්ෂර ක්‍රමය භාවිතා කරමින් ලබා දීමේ රීතියක් පනවා සම්මත කර ගන්නා ලෙස ගෞරවණීය මෙම සභාවට යෝජනා කරමි.
2. 139 වැනි වාර්ෂික මහා සභාව දක්වා පවත්වා ගෙන ආ න්‍යාය පත්‍රය අනුව පාලන කමිටුවට අපේක්ෂකයින් තෝරා ගැනීමේ නිලවරණය සභාවේ සියළු කටයුතු අවසන් වීමෙන් පසුව පැවැත්වීමට කටයුතු සිදු කරන ලෙස යෝජනා කරමි.

**(8) හෙන්දාවිතාරණ කරුණාදාස මයා (සාමාජික අංකය - 10765)**

1. රාජ්‍ය සේවා අන්‍යෝන්‍යාධාර අර්ථ සාධක සංගමය 1891 අංක 05 දරණ ආඥා පනතින් සංස්ථාපිත කර ඇති අතර ඉන් පසුව අනුෂාංගික 283 හා 474 වැනි අධිකාරි මගින් හා පනත් මගින් වරින්වර සංශෝධනය කර ඇත. දැනට බලාත්මක වන්නේ 474 වැනි අධිකාරිය වන ආඥා පනතයි. 1991 අංක 35 දරණ සංශෝධිත පනතින් සංගමයේ සාමාජිකයින් දිරිගැන්වීම, සකසුරුවම, ආපදා අවස්ථාවන්හිදී සහන සැලසීම, භාර්යාව හා නීත්‍යානුකූල දරුවන්ට සහන සැලසිම, පොදු පරමාර්ථ ලෙස සඳහන් කර ඇත. මේ අයුරින් සුභසාධනමය කාර්යයන් ඉටු කරන රාජ්‍ය සේවා අන්‍යෝන්‍යාධාර අර්ථ සාධක සංගමය දේශීය ආදායම් බදු පනතේ "සාමාජශාලා ගණයට ඇතුලත් කර ආදායම් බදු අයකර ගනී."
   නමුත් රාජ්‍ය සේවා අන්‍යෝන්‍යාධාර අර්ථ සාධක සංගමය ලාභ ලබන සාමාජශාලාවක් නොව සුභසාධන සංගමයක් වන හෙයින් ද මේ නිසා සාමාජිකයින්ට බලවත් අසාධාරණයක් සිදුවන හෙයින් ද 2005 වසරේ දී රාජ්‍ය හා පළාත් සභා සේවකයින්ට සහන සලසන ලෝහෝර් ආර්යා ණය අරමුදල වැනි ආදායම් බදු පනතින් නිදහස් කර ඇති බවට පූර්වාදර්ශයක් පවතින හෙයින් ද මෙම සංගමයටත් බදු සහනයක් ලබා ගැනීම සඳහා වර්තමාන ජනාධිපති හා මුදල් අමාත්‍යතුමා හට ඉල්ලීමක් කර සාකච්ඡා කර බදු සහනයක් ලබා ගැනීම සුදුසු බව යෝජනා කරමි.
2. සංගමයේ වාර්ෂික වාර්තාව හා ඡන්ද පත්‍රිකා ආදිය මුද්‍රණය කිරීම සඳහා පෞද්ගලික ආයතන වෙත යොමු කිරීම වෙනුවට රාජ්‍ය මුද්‍රණ නීතිගත සංස්ථාවෙන් මිල ගණන් ලබා ගෙන එම කටයුතු ඉටු කර ගැනීම සුදුසු බව යෝජනා කරමි.

3. රාජ්‍ය සේවා අන්‍යෝන්‍යාධාර අර්ථ සාධක සංගමය 2010.07.24 දින සිට බලාත්මක වන පරිදි සම්මත කරන ලද කාර්ය පටිපාටි අත්පොතේ 1.3.1 හා 4.1.3 වගන්තිවලට අනුකූල නොවන පරිදි තනතුරක් මත සහකාර ගණකාධිකාරී ලෙස 2011.08.01 දින සිට ක්‍රියාත්මක වන ලෙස 2011.07.19 දින කමිටුව විසින් අනුමත කර බඳවා ගෙන ඇත. ඉන් අනතුරුව බඳවා ගැනීමේ ක්‍රියාපටිපාටියට අනුකූල නොවන පරිදි 2017.10.26 දින කළමනාකරණ කමිටුව විසින් 2016.08.01 දිනට පෙරදාතම් කර ගණකාධිකාරී තනතුරට උසස් කර කළමනාකරණ සේවා චක්‍රලේඛ අනුව රාජ්‍ය සේවා හා ව්‍යවස්ථා මණ්ඩලවලට අනුමත 2016 – M.N.1 වැටුප් පරිමා ණ ලබා දෙමින් සංගමයට මූල්‍යමය පාඩුවක් හා අවිධිමත් පත් කිරීමක් කිරීමෙන් දූෂණ ක්‍රියාවක් සිදු කර ඇත. මෙම සංගමයේ ගණකාධිකාරී තනතුරට පත් කිරීමේ ක්‍රමවේදය ප්‍රශ්ණ ගත බැවින් විධිමත් පරීක්ෂණයක් සඳහා අපක්ෂපාතී පරීක්ෂණ මණ්ඩලයක් පත්කර මෙම තනතුරට පත් කිරීම හා වැටුප් ගෙවීම පිළිබඳව සුදුසු ක්‍රියාමාර්ග ගැනීම සුදුසු බවට යෝජනා කරමි.

4. රාජ්‍ය සේවා අන්‍යෝන්‍යාධාර අර්ථ සාධක සංගමය 1980.12.31 දින සිට බලාත්මක බවට ප්‍රකාශිත 474 වන අධිකාරිය වන ආඥා පනතේ 16 වන වගන්තිය ප්‍රකාර 132 සිට 135 දක්වා පැවැති වාර්ෂික මහ සභා රැස්වීම්වල දී සම්මත කර ගන්නා ලද රීතින් 2021.11.16 දින මුදල් අමාත්‍යවරයාගේ අනුමැතිය ලබා ගෙන ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා යොමු කර ඇත. මුදල් අමාත්‍යාංශයේ බලධාරීන් මෙම රීති සංශෝධනයට අදාල නැති 23 වැනි වගන්තිය පටලවා ගෙන අනවබෝධයෙන් ක්‍රියා කරන බැව් ඉතා පැහැදිලිය. මෙම සංගමයේ රීති සංශෝධනය සඳහා අදාල වනුයේ 16 වැනි වගන්තිය බැව් 283 හා 474 අධිකාරී උපයෝගී කර ගෙන 2018.03.06 දක්වා රීති සංශෝධන වලින් සනාථ කර ගත හැකිය. මෙම රීති සංශෝධන 2018.03.06 න් පසුව අනුමත කර ගැසට් කිරීම ප්‍රමාදය සංගමයේ ඉදිරි කටයුතු සඳහා බාධාවක් විය හැකි බැවින් මුදල් අමාත්‍යාංශයේ අවධානය යොමු කර ගැසට් පත්‍රයේ පළ කිරීමට අවශ්‍ය ක්‍රියා මාර්ග ගන්නා ලෙස යෝජනා කරමි.

5. පහත දැක්වෙන පරිදි 17 (III) රීතිය සංශෝධනය කිරීමට යෝජනා කරමි.

"භාණ්ඩාගාරයේ නියෝජ්‍ය ලේකම්වරයාගේ එකඟත්වයට යටත්ව රජයේ සහ වෙළඳපොලේ උච්චාවචනය වන පොළී අනුපාත සැලකිල්ලට ගෙන සංගමය ලබා දෙන ණය සංශෝධනය කිරීමේ බලය මහ සභාවේ අනුමැතියට යටත් විය යුතු අතර පොළිය සංශෝධන කිරීමේ බලය පාලන කමිටුවට ඇත. මහා සභා රැස්වීමක් අවමය සාමාජිකයින් 250 කගේ සහභාගිත්වයෙන් සිදු කළ හැක."

**නාම යෝජනා**

**2025/2026 වර්ෂය සඳහා කළමනාකරණ කමිටුවට සාමාජිකයන් 11 දෙනෙකු තෝරා පත් කර ගැනීම.**

| ඡන්ද පත්‍රිකාවේ සඳහන් අංකය | අපේක්ෂකයාගේ නම සහ සේවා ස්ථානය | යෝජනාකරුගේ නම සහ සේවා ස්ථානය | ස්ථිරකරුගේ නම සහ සේවා ස්ථානය |
|---|---|---|---|
| 01 | අන්තෝනිගේ ලසිත් නලන්ත මයා (රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුව, 341/7,කෝට්ටේ පාර, රාජගිරිය) | ඩී.එම්.ඩී. දිසානායක මිය (විශ්‍රාමික) | එස්.එස්.ජයතිලක මිය (රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුව) |
| 02 | ආරච්චි මුහන්දිරම්ලාගේ අසංග දයාරත්න මයා (විශ්‍රාමික) | ඩී.එම්.ඩී. දිසානායක මිය (විශ්‍රාමික) | ටී.ඩී.එම්.ශ්‍රී. ඩී. පෙරේරා මයා (ජන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව) |
| 03 | ඉඩමේ හේරත් මුදියන්සේලාගේ මංගලිකා පුෂ්පකුමාරි මිය (අධිකරණ අමාත්‍යාංශය, ශ්‍රී සංඝරාජ මාවත, කොළඹ 10) | වයි.කේ. රෝෂිණී මිය (නාගරික ඉංජිනේරු දෙපාර්තමේන්තුව, කොළඹ මහ නගර සභාව) | බී.විජේසිංහ මයා (මිනින්දෝරු දෙපාර්තමේන්තුව) |
| 04 | ඉමදූව විතානගේ අනුලා මිය (විශ්‍රාමික) | ඩබ්.බී.පී.පෙරේරා මයා (විභාග දෙපාර්තමේන්තුව) | අයි.එච්.දේවසිරිනාරායන මයා (මිනින්දෝරු දෙපාර්තමේන්තුව) |
| 05 | ඉෂාර හසිත් දේවසිරිනාරායන මයා (මිනින්දෝරු දෙපාර්තමේන්තුව, නාරාහේන්පිට,කොළඹ 05) | එච්.එස්.පී.ද සොයිසා මිය (විශ්‍රාමික) | ඩී.එම්.ඩී. දිසානායක මිය (විශ්‍රාමික) |
| 06 | එදිරිසිංහ ආරච්චිගේ ගාමිණී සරත් පෙරේරා මයා (විශ්‍රාමික) | ඩබ්.ජී.ජී.පී.ජයසිංහ මයා (ජන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව) | වී.ජී.කරුණාරත්න මයා (ප්‍රාදේශිය ලේකම් කාර්යාලය-කිරිඳිවැල) |
| 07 | කාරියවසම් තෙලිකඩ ගමගේ ශ්‍යාමලී කාරියවසම් මිය (දන්ත වෛද්‍ය ශික්ෂණ රෝහල, කොළඹ 07) | එන්.එම්.විජේරත්න මයා (රථ වාහන පාලන අංශය, කොළඹ මහ නගර සභාව, කොළඹ 07) | පී.ජී.විජේසිංහ මයා (රිජ්වේ ආර්ය ළමා රෝහල) |
| 08 | කැටිපෙ ආරච්චි අමරසිරි මයා (විශ්‍රාමික) | එන්.එම්.විජේරත්න මයා (රථ වාහන පාලන අංශය, කොළඹ මහ නගර සභාව, කොළඹ 07) | පී.ජී.විජේසිංහ මයා (රිජ්වේ ආර්ය ළමා රෝහල) |
| 09 | කුලප්පු තන්ත්‍රිගේ නාමලි රසිකා මිය (කර්මාන්ත හා ව්‍යවසායකත්ව සංවර්ධන අමාත්‍යාංශය, නාරාහේන්පිට, කොළඹ 05) | කේ.එන්.ඩී.ජයසුන්දර මිය (රාජ්‍ය පරිපාලන පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය) | ඊ.එස්.එස්.පෙරේරාමයා (ක්‍රිස්තියානි ආගමික කටයුතු දෙපාර්තමේන්තුව) |
| 10 | ගංගොඩ වත්තේ ජයලත් සමන් කුමාර මයා (අධිකරණ අමාත්‍යාංශය, සංඝරාජ මාවත, කොළඹ 10) | වී.පී.අයි.යූ. කුමාරි මිය (අධිකරණ අමාත්‍යාංශය) | ටී.එම්.ජී.පී.තෙන්නකෝන් මිය (අධිකරණ අමාත්‍යාංශය) |
| 11 | තෙබුවන ආරච්චිගේ බුද්ධදාස මයා (විශ්‍රාමික) | ඩී.ඩබ්.එස්.එන්. සිල්වා මිය (විශ්‍රාමික) | එම්.ජී.සමරසිංහ මයා (බලශක්ති අමාත්‍යාංශය) |

| ඡන්ද පත්‍රිකාවේ සඳහන් අංකය | අපේක්ෂකයාගේ නම සහ සේවා ස්ථානය | යෝජනාකරුගේ නම සහ සේවා ස්ථානය | ස්ථිරකරුගේ නම සහ සේවා ස්ථානය |
|---|---|---|---|
| 12 | දිලිනි අසෝකා ජයවර්ධන මිය (කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලය, මුදල් අමාත්‍යාංශය, කොළඹ 01) | එස්.එන්.සතරසිංහ මිය (මිනින්දෝරු දෙපාර්තමේන්තුව) | ජී.අයි.ඩී.එන්. චාන්දනී මිය (ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂක කාර්යාලය-කළුතර) |
| 13 | දිසානායක මුදියන්සේලාගේ දයානි දිසානායක මිය (විශ්‍රාමික) | එච්.එස්.පී. ද සොයිසා මිය (විශ්‍රාමික) | අයි.එච්.දේවසිරිනාරායන මයා (මිනින්දෝරු දෙපාර්තමේන්තුව) |
| 14 | දෙල්පවිත්‍ර ආචාරිගේ ශාන්ත ජයලත් දෙල්පවිත්‍ර මයා (ධීවර,ජලජ හා සාගර සම්පත් අමාත්‍යාංශය,2 වන මහළ, මාළිගාවත්ත, කොළඹ 10) | ඩබ්.එන්.ජයසිංහ මයා (ධීවර,ජලජ හා සාගර සම්පත් අමාත්‍යාංශය) | ආර්.එච්.පී.එන්. කේ.රණමුක මයා (ධීවර,ජලජ හා සාගර සම්පත් අමාත්‍යාංශය) |
| 15 | දෙවුන්දර ලියනවඩුගේ තිලකරත්න මයා (විශ්‍රාමික) | පී.ජී.එස්.සමරක්කොඩි මයා (කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුව) | එන්.එම්.විජේරත්න මයා (රථ වාහන පාලන අංශය, කොළඹ මහ නගර සභාව, කොළඹ 07) |
| 16 | දොන් ප්‍රේමචන්ද්‍ර සමරසිංහ මයා (විශ්‍රාමික) | පී.ජී.එස්.සමරක්කොඩි මයා (කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුව) | ඩී.කේ. සුභසිංහ මයා (කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුව) |
| 17 | නිහරේපොල මුදියන්සේලාගේ විජේරත්න මයා (රථවාහන පාලක අංශය, කොළඹ මහ නගර සභාව,කොළඹ 07) | පී.ජී.විජේසිංහ මයා (රිජ්වේ ආර්ය ළමා රෝහල) | කේ.ඒ.අමරසිරි මයා (විශ්‍රාමික) |
| 18 | පහල ගෙදර විජේසිංහ මයා (රිජ්වේ ආර්ය ළමා රෝහල, බොරැල්ල, කොළඹ 08) | එන්.එම්.විජේරත්න මයා (රථ වාහන පාලන අංශය, කොළඹ මහ නගර සභාව, කොළඹ 07) | කේ.ටී.ජී.එස්. කාරියවසම් මිය (දන්ත වෛද්‍ය ශික්ෂණ රෝහල, කොළඹ 07) |
| 19 | පින්නගස්පිටියේ ගෙදර සමරසිංහ සමරක්කොඩි මයා (කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුව, ඔල්කට් මාවත, කොළඹ-10) | බී.විජේසිංහ මයා (මිනින්දෝරු දෙපාර්තමේන්තුව) | ඩබ්.එම්.එම්.පී. වීරසිංහ මයා (කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුව) |
| 20 | පෙරුමාහන්දි අනුජා ශ්‍රී ලක්මානි මුනිදාස මිය (ක්‍රිස්තියානි ආගමික කටයුතු දෙපාර්තමේන්තුව, කොළඹ 10) | ඊ.එස්.එස්.පෙරේරා මයා (ක්‍රිස්තියානි ආගමික කටයුතු දෙපාර්තමේන්තුව) | කේ.එන්.ඩී.ජයසුන්දර මිය (රාජ්‍ය පරිපාලන පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය) |
| 21 | බුද්ධික විජේසිංහ මයා (මිනින්දෝරු දෙපාර්තමේන්තුව, කොළඹ 05) | ඩබ්.එච්.එස්.පී.පී. කුලවංශ මයා (විශ්‍රාමික) | අයි.එච්.එම්.එම්. පුෂ්පකුමාරි මිය (අධිකරණ අමාත්‍යාංශය) |

| ඡන්ද පත්‍රිකාවේ සඳහන් අංකය | අපේක්ෂකයාගේ නම සහ සේවා ස්ථානය | යෝජනාකරුගේ නම සහ සේවා ස්ථානය | ස්ථිරකරුගේ නම සහ සේවා ස්ථානය |
|---|---|---|---|
| 22 | මාගලගේ ස්වර්ණා මංගලිකා පෙරේරා මිය (තරුණ කටයුතු සහ ක්‍රීඩා අමාත්‍යාංශය,නො.09, පිලිප් ගුණවර්ධන මාවත, කොළඹ 07) | එම්.එන්.කේ. මෙන්ඩිස් මයා (තරුණ කටයුතු සහ ක්‍රීඩා අමාත්‍යාංශය,නො.09, පිලිප් ගුණවර්ධන මාවත, කොළඹ 07) | ඒ.බී.එම්.එස්. චන්ද්‍රමාලි මිය (තරුණ කටයුතු සහ ක්‍රීඩා අමාත්‍යාංශය,නො.09, පිලිප් ගුණවර්ධන මාවත, කොළඹ 07) |
| 23 | යුසුප් ක්‍රිශාන්තා රෝෂිණි මිය (නාගරික ඉංජිනේරු දෙපාර්තමේන්තුව, කොළඹ මහ නගර සභාව, කොළඹ 07) | අයි.එච්.එම්.එම්. පුෂ්පකුමාරි මිය (අධිකරණ අමාත්‍යාංශය) | එෆ්.එස්.එම්.සාහිබු මිය (නාගරික ඉංජිනේරු දෙපාර්තමේන්තුව, කොළඹ මහ නගර සභාව, කොළඹ 07) |
| 24 | වැලිවිට ලියන ආරච්චිලාගේ හරින්ද්‍ර වැලිවිට මයා (විශ්‍රාමික) | ජී.එම්.ඩී.එන්.ජීවන්දරගේ මිය (ආගමන විගමන දෙපාර්තමේන්තුව) | ඩී.එම්.ඩී. දිසානායක මිය (විශ්‍රාමික) |
| 25 | වැලිවිටිගොඩ හේවගේ සාන්ත පැරකුම්බා පර්සි කුලවංශ මයා (විශ්‍රාමික) | බී. විජේසිංහ මයා (මිනින්දෝරු දෙපාර්තමේන්තුව, කොළඹ 05) | අයි.එච්.එම්.එම්. පුෂ්පකුමාරි මිය (අධිකරණ අමාත්‍යාංශය) |
| 26 | ශන්මුගනාදන් ශන්මුගප්‍රභා මයා (විශ්‍රාමික) | අයි.එන්.ඩී.පෙරේරා මිය (ප්‍රාදේශිය ලේකම් කාර්යාලය-මදුරාවල) | ආර්.එස්.ප්‍රියංකර මයා (රේගු දෙපාර්තමේන්තුව, කොළඹ11) |
| 27 | සුදසිංහ පතිරන්නහෙලාගේ විජයරත්න මයා (විශ්‍රාමික) | එස්.එස්.ජයතිලක මිය (රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුව) | ඒ.එල්.නලන්ත මයා (රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුව) |
| 28 | සුබෝධා සමන්මලී ජයතිලක මිය (රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුව, 341/7,කෝට්ටේ පාර,රාජගිරිය) | ඩී.එම්.ඩී. දිසානායක මිය (විශ්‍රාමික) | ඒ.එල්.නලන්ත මයා (රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුව) |
| 29 | හීතක ශ්‍යාමා ප්‍රියන්ති ද සොයිසා මිය (විශ්‍රාමික) | ඒ.එන්.ඩී. සොයිසා මිය (නාගරික තක්සේරු දෙපාර්තමේන්තුව, කොළඹ මහ නගර සභාව, කොළඹ 07) | ඩී.එම්.ඩී. දිසානායක මිය (විශ්‍රාමික) |
| 30 | හෙට්ටි ආරච්චිගේ සමන්ත මයා (නියෝජ්‍ය අධිකාරි ගමනාගමන කොළඹ කාර්යාලය, ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුව, කොළඹ 10) | එම්.සී.සී.සෙනෙවිරත්න මිය (ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුව, කොළඹ 10) | පී.කේ.ශාලිනී මිය (ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුව, කොළඹ 10) |
| 31 | හෙන්දා විතාරණගේ කරුණාදාස මයා (විශ්‍රාමික) | ඩී.එම්.ඩී.දිසානායක මිය (විශ්‍රාමික) | එච්.එස්.පී.ද සොයිසා මිය (විශ්‍රාමික) |
| 32 | හේරත් මුදියන්සේලාගේ විජය කුමාර හේරත් මයා (අග්‍රාමාත්‍ය කාර්යාලය,කොළඹ 07) | එම්.කේ.එන්. විජේරත්න මිය (වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව) | කේ.එම්.ඥාණවර්ධන මයා (සිරිමාවෝ බණ්ඩාරණායක විද්‍යාලය) |
| 33 | හේරත් මුදියන්සේලාගේ හේරත් බණ්ඩාර හේරත් මයා (විශ්‍රාමික) | ඩී.එම්.ඩී. දිසානායක මිය (විශ්‍රාමික) | ඩී.ඒ. ජයවර්ධන මිය (මුදල් අමාත්‍යාංශය) |

## රාජ්‍ය සේවා අන්‍යොන්‍යාධාර අර්ථසාධක සංගමයේ 2024 ඔක්තෝබර් මස 12 වන දින කොළඹ රාජකීය විද්‍යාලයේ නව රඟහලේ දී පවත්වන ලද 140 වන මහා සභා රැස්වීමේ වාර්තාව.

රාජ්‍ය සේවා අන්‍යොන්‍යාධාර අර්ථසාධක සංගමයේ 140 වන වාර්ෂික මහා සභා රැස්වීමේ සමාරම්භය සනිටුහන් කරමින් පෙරවරු 8.45 ට සංගමයේ සභාපති ආචාර්ය.එච්.ඒ.එන්.එස්.කුමාර මහතා විසින් පැමිණ සිටි සියලුම සාමාජිකයින් ඉතා ගෞරවයෙන් පිළිගනිමින් රැස්වීම ආරම්භ කරන ලදී.

**01. ජාතික කොඩිය එසවීම.**

සභාපතිතුමාගේ ආරාධනය පරිදි ජ්‍යෙෂ්ඨ සාමාජික ජී.ඩී.ජයරත්න මහතා (සා.අංක 11423)විසින් ජාතික කොඩිය එසවීම සිදු කරන ලද අතර ජාතික ගීය ගායනා කිරීමෙන් අනතුරුව න්‍යායපත්‍රානුකූලව රැස්වීමේ ඉදිරි කටයුතු ආරම්භ කරන ලදී.

**02. රැස්වීම කැඳවීමේ නිවේදනය කියවීම.**

සංගමයේ සහකාර ලේකම් ආර්.ඩබ්.ශිරෝමිකා රෝශිණි විතාරණ මහත්මිය විසින් සිංහල භාෂාවෙන් ද සංගම් කාර්යාලයේ කළමනාකරණ සහකාර එච්.ඕ.එෆ්.අස්නා මෙනවිය විසින් දෙමළ භාෂාවෙන්ද, සංගම් කාර්යාලයේ කළමනාකරණ සහකාර ආර්.ඕ.වී.ලියනගේ මෙනවිය විසින් ඉංග්‍රීසි භාෂාවෙන් ද රැස්වීම කැඳවීමේ නිවේදනය ප්‍රකාශ කරන ලදී.

**03.මිය ගිය සාමාජිකයන් සහ දේශය වෙනුවෙන් දිවි පිදූ රණවිරුවන් සිහි කිරීම.**

මියගිය සාමාජිකයින් සහ දේශය වෙනුවෙන් දිවි පිදූ සියළු රණවිරුවන් සිහිකරනු වස් විනාඩියක නිශ්ශබ්දතාවයක් සභාපතිතුමා විසින් නිවේදනය කරන ලදී. ඒ අනුව සියලුම දෙනා නැඟී සිට මියගිය සාමාජිකයින් සහ දිවිපිදූ රණවිරුවන් සිහිපත් කරමින් විනාඩියක නිශ්ශබ්දතාවයක් පළ කරන ලදී.

**04. සංගමයේ ප්‍රගති සමාලෝචන වාර්තාව ඉදිරිපත් කිරීම.**

සංගමයේ සභාපතිතුමා විසින් 2023 වර්ෂය තුළ සංගමයේ ප්‍රගතිය සපුරාගත් ඉලක්ක ආදිය පිළිබඳව විස්තර කරමින් සංගමයේ ප්‍රගතිය සම්බන්ධයෙන් කරුණු ඉදිරිපත් කිරීමක් (Presentation) සිදුකරන ලදී.

**05. සාමාජිකයන් සිය දෙනෙකු සඳහා ජ්‍යෙෂ්ඨ සාමාජිකත්ව දීමනා ප්‍රදානය.**

2023 වර්ෂයට අදාල පහත නම් සඳහන් ජ්‍යෙෂ්ඨ සාමාජිකයින් සිය දෙනා හට මෙම දීමනාව ලබා ගැනීමට වේදිකාවට පැමිණෙන ලෙසට සහකාර ලේකම් විසින් නිවේදනය කරන ලද අතර එදින පැමිණි සිටි ජ්‍යෙෂ්ඨ සාමාජිකයින් සංගමයේ සභාපතිතුමා  සහ භාණ්ඩාගාර නියෝජිත ඩබ්.ඒ.එස්.ඉරෝෂන් මහතා අතින් එම දීමනාව ලබා ගන්නා ලදී.

**2023 වර්ෂය සඳහා ජ්‍යෙෂ්ඨ සාමාජිකත්ව දීමනා හිමි නාම ලේඛනය**

| අ.අ | සා.අ. | නම | අ.අ | සා.අ. | නම |
|---|---|---|---|---|---|
| 1 | 12017 | ජී.ඩබ්.විමලසිරිමහතා | 51 | 12221 | ඩබ්.පහලවිතානමහතා |
| 2 | 12022 | ඩී.එම්.ප්‍රේමරත්නමහතා | 52 | 12225 | ඩබ්.ඒ.ඩී.ගුණරත්නමහතා |
| 3 | 12024 | ඩබ්.ඩබ්.ඩී.ආර්.ඩී.බී.විජේසේකරමහතා | 53 | 12227 | කේ.කේ.ඩී.සිරිසේනමහතා |
| 4 | 12025 | පී.වී.පී.සෝමපාලමහතා | 54 | 12230 | කේ.එම්.ගුණදාසමහතා |
| 5 | 12027 | පී.එල්.ආර්.පන්නිලමහතා | 55 | 12238 | කේ.රාජාමහතා |
| 6 | 12028 | යූ.එල්.පියතිලකමහතා | 56 | 12243 | වයි.ඒ.ජේ.පෙරේරාමහතා |
| 7 | 12034 | ඩී.බී.ජයසුන්දරමහතා | 57 | 12250 | එච්.එස්.ඩී.එස්.ජයතිලකමහතා |
| 8 | 12037 | එම්.එල්.එම්.මුබාරක්මහතා | 58 | 12251 | එන්.එච්.ජී.එස්.හැගොඩමහතා |
| 9 | 12040 | ඒ.තිරුණවාකරසුමහතා | 59 | 12253 | ඩී.එස්.රාමනායකමහතා |
| 10 | 12043 | ඒ.කරුණාරත්නමහතා | 60 | 12256 | ඩබ්.හංවැල්ලගේමහතා |
| 11 | 12048 | ජී.හේවාගමමහතා | 61 | 12258 | එච්.ඒ.අමරතුංගමහතා |

| | | | | | |
|---|---|---|---|---|---|
| 12 | 12050 | කේ.ඒ.ධර්මවර්ධනමහතා | 62 | 12264 | ආර්.එම්.ඩී.බී.රත්නායකමහතා |
| 13 | 12051 | බී.කරුණාසේන මහතා | 63 | 12266 | ඩබ්.එච්.එස්.විජේතිලකමහතා |
| 14 | 12053 | ඩබ්.එම්.ආර්.බී.කීනපිටියමහතා | 64 | 12269 | එච්.ඩී.තිලකරත්නමහතා |
| 15 | 12057 | සී.අබේකෝන්මහතා | 65 | 12270 | එස්.ඩබ්.ගුණරත්නමහතා |
| 16 | 12062 | කේ.රාජරත්නම්මහතා | 66 | 12276 | පී.වී.ගමගේමහතා |
| 17 | 12067 | එස්.ආර්.ගුණතිලකමහතා | 67 | 12277 | කේ.පියදාසමහතා |
| 18 | 12068 | ආර්.ජී.ජේ.වරකාදෙණියමහතා | 68 | 12287 | ඒ.ඒ.විජේතුංගමහතා |
| 19 | 12073 | එස්.පුණ්‍යසීලන්මහතා | 69 | 12298 | එස්.අරන්දරමහතා |
| 20 | 12079 | සී.පුණ්‍යමූර්තිමහතා | 70 | 12302 | ජේ.එම්.යූ.ජයසේකරමහතා |
| 21 | 12086 | එන්.සෙල්වරත්නම්මහතා | 71 | 12305 | පී.එච්.ජේ.සිල්වාමහතා |
| 22 | 12097 | පී.එම්.පටබැඳිගේ | 72 | 12306 | එම්.ඩී.පී.ගුණතිලකමහතා |
| 23 | 12099 | එස්.වී.විපුලගුණමහතා | 73 | 12309 | ඩබ්.ඩබ්.උබේරත්නමහතා |
| 24 | 12102 | ඒ.හේරත්මහතා | 74 | 12311 | කේ.ඩී.එල්.ගුණවර්ධනමහතා |
| 25 | 12105 | ඩී.පී.සමරසිංහමහතා | 75 | 12313 | ඩබ්.ජී.කුලතිලකමහතා |
| 26 | 12111 | එච්.පතිරනමහතා | 76 | 12317 | එස්.එස්.ඊ.රණවනමහතා |
| 27 | 12118 | එස්.මාලියැද්දමහතා | 77 | 12320 | යූ.සමරවික්රමමහතා |
| 28 | 12119 | ඩී.සී.ආර්.ධර්මරත්නමහතා | 78 | 12322 | ඒ.එච්.එම්.සුබෙයිර්මහතා |
| 29 | 12121 | එස්.ඒ.රන්වත්තමහතා | 79 | 12331 | එන්.එගම්පරනාතන්මහතා |
| 30 | 12122 | බී.එස්.ඩී.සිල්වාමහතා | 80 | 12337 | බී.ඩී.වික්රමනායකමහතා |
| 31 | 12123 | එල්.පෙම්මාවඩුමහතා | 81 | 12339 | බී.ජී.වික්රමසිංහමහතා |
| 32 | 12130 | එම්.එස්.ජී.එන්.දසිල්වාමහතා | 82 | 12347 | ටී.පෙරේරාමිය |
| 33 | 12136 | ජී.ඩබ්.ආර්.දසිල්වාමහතා | 83 | 12348 | ඩී.ඊ.ගමගේමිය |
| 34 | 12139 | එල්.සමරවික්‍රමමහතා | 84 | 12349 | බී.එල්.ධර්මසේනමහතා |
| 35 | 12140 | ඒ.ඒ.ඊ.සෙනෙවිරත්නමහතා | 85 | 12352 | ඩී.ජී.මාතුපාලමහතා |
| 36 | 12141 | ඩී.එස්.එල්.ජයකොඩිමහතා | 86 | 12353 | පී.ජේ.දිසානායකමහතා |
| 37 | 12145 | කේ.ඩී.කේ.එස්.ජයවර්ධනමහතා | 87 | 12357 | පී.රණවකමහතා |
| 38 | 12146 | පී.කිතලවආරච්චිමහතා | 88 | 12365 | පී.තිරුනවාකරසුමහතා |
| 39 | 12159 | වී.ක්රිෂ්නරාජාමහතා | 89 | 12366 | පී.එච්.සමරජීවමහතා |
| 40 | 12169 | කේ.එම්.ආරියරත්නමහතා | 90 | 12369 | කේ.සිරිමාරත්නමහතා |
| 41 | 12170 | එච්.එම්.ජී.එච්.විජේවර්ධනමහතා | 91 | 12370 | ඒ.හෙට්ටිආරච්චිමහතා |
| 42 | 12180 | එම්.රණස්ගල්ලමහතා | 92 | 12372 | පී.ජේ.සී.පෙරේරාමහතා |
| 43 | 12182 | කේ.නන්දිරත්නමහතා | 93 | 12377 | ඒ.ආර්.ධර්මදාසමහතා |
| 44 | 12184 | ඒ.ජී.ටී.ගම්වරමහතා | 94 | 12386 | ඒ.ඒ.ලොයිඩ්මහතා |
| 45 | 12190 | පී.පිටදෙනියමහතා | 95 | 12389 | ඒ.ප්රේමදාසමහතා |
| 46 | 12197 | ඊ.කේ.සිරිපාලමහතා | 96 | 12390 | එච්.ඩී.එස්.එස්.විජේරත්නමහතා |
| 47 | 12198 | එච්.ඩබ්.නන්දසේනමහතා | 97 | 12394 | එන්.වාගේස්මූර්තිමහතා |
| 48 | 12209 | එන්.සතනන්තන්මහතා | 98 | 12400 | සී.ඩබ්.ඩබ්.ගමනායකමහතා |
| 49 | 12217 | වී.චන්ද්රසේකරමහතා | 99 | 12402 | පී.දනන්සූරියමහතා |
| 50 | 12219 | එස්.ජී.තිලකරත්නමහතා | 100 | 12405 | ජේ.එම්.එන්.සී.පායිවාමහතා |

**06. 2022 වර්ෂයේ අපොස අ.පො.ස (උසස් පෙළ) ප්‍රතිඵල මත විශ්ව විද්‍යාල ප්‍රවේශය සඳහා තෝරා ගත් සාමාජිකයින්ගේ දරුවන් සඳහා ශිෂ්‍යත්ව ප්‍රදානය.**

2022 වර්ෂයේ අ.පො.ස (උසස් පෙළ) විභාගයෙන් සමත්වී විෂයධාරාවන් 7 ක් යටතේ වැඩිම Z අගයක් (Z Score) ලබා ගත් සාමාජිකයින්ගේ දරුවන් වෙනුවෙන් ඔවුන්ගේ විශ්වවිද්‍යාලයීය පාඨමාලා කාලය පුරාවටම මාසික ශිෂ්‍යාධාරයක් පිරිනැමුණු අතර, මෙවර නීති සහ ජෛව තාක්ෂණවේදය යන විෂයධාරාවන් යටතේ ශිෂ්‍යාධාර ලබා ගැනීම සඳහා කිසිදු අයදුම්කරුවෙකු ඉදිරිපත් වී නොතිබුණි. එම නිසා පහත නම් සඳහන් සිසුන් පස්දෙනා වෙනුවෙන් මෙවර ශිෂ්‍යාධාර පිරිනමන ලදී.

| අනු අංකය | සාමාජික අංකය | සාමාජිකයාගේ නම | ශිෂ්‍යයාගේ නම | විෂය ධාරාව | Z-Score අගය |
|---|---|---|---|---|---|
| 1 | 24055 | අයි.එස්.නරසිංහ මිය | පී.බී.මුණසිංහ මෙය | වෛද්‍ය (දිවයිනේ ප්‍රථම ස්ථානය ලබා ගෙන ඇත) | 3.2089 |
| 2 | 23572 | පී.කේ.සිටිනාමලුව මිය | ජේ.එස්.විජේතිලක මයා | ඉංජිනේරු | 2.8384 |
| 3 | 19054 | කේ.එස්.ගුරුසිංහ මයා | පී.පී.ගුරුසිංහ මෙය | කළමනාකරණ | 2.2456 |
| 4 | 23551 | එස්.ඒ.ආර්.යූ.කුමාර මයා | එස්.ඒ.ඒ.මතීෂ මයා | ඉංජිනේරු තාක්ෂණවේදය | 2.1630 |
| 5 | 21992 | ඩබ්.නාමලී මිය | එස්.ඒ.වික්‍රමගේ මෙය | කලා | 1.9493 |
| 6 | මෙම විෂයධාරා යටතේ කිසිදු අයදුම්කරුවෙකු ඉදිරිපත් වී නොමැත. | | | නීති | |
| 7 | | | | ජෛව තාක්ෂණවේදය | |

**07. නිල යෝජනා ඉදිරිපත් කිරීම හා සාකච්ඡා කිරීම.**

**යෝජනා අංක I :-**

"වඩාත් ඵලදායී අයුරින් අනුරාධපුර, කටුකැලියාව නිවාඩු නිකේතනයේ සේවය ලබා දීම සඳහා එක් සාමාජිකයෙකුට වසරකට එක් දිනක් වන පරිදි පස් දෙනෙකුගේ උපරිමයකට යටත්ව එක් කාමරයක් නොමිලේ ලබා දීමට යෝජනා කරමු. (කාමර පහසුකම් පමණක්) මේ සඳහා එක් සාමාජිකයකුගෙන් මසකට රු.10/= ක් අය කිරීමට යෝජනා කරමු. (2024.11.01 දින සිට ක්‍රියාත්මක වේ)"

සාමාජිකයා ඇතුළු පස් දෙනෙකුට මෙම අවස්ථාව ලැබෙන හෙයින් සහ සාමාජිකයෙකුගෙන් රු.100/= බැගින් අයකර මෙම නිවාඩු නිකේතනයේ අලුත්වැඩියා කටයුතු කර තිබීමත් හේතුවෙන් මෙම යෝජනාව හොඳ යෝජනාවක් බවට පී.ජී.එස්.සමරක්කොඩි මහතා (සා.අං.25299) සහ එස්.කුගදාසන් මහතා (සා.අං.13151) විසින් අදහස් පල කළ අතර යම් අලාභයක් වුවහොත් ඉදිරියේදී වෙනස් කිරීමට යටත්ව එක් සාමාජිකයෙකුගෙන් මසකට රු.10/= ක් අයකරමින් අනුරාධපුර කටුකැලියාව නිවාඩු නිකේතනයේ එක් කාමරයක් එක් සාමාජිකයෙකුට වසරකට එක් දිනක් වන පරිදි 5 දෙනෙකුගේ උපරිමයකට යටත්ව සාමාජිකයෙකු හට කාමර පහසුකම් පමණක් නොමිලේ ලබා දීම සුදුසු බව සභාවේ බහුතර එකඟතාවය මත තීරණය කරන ලදී. එමෙන්ම මෙම තීරණය 2024.11.01 දින සිට ක්‍රියාත්මක වන බවටත් තීරණය කරන ලදී.

මෙම යෝජනාව සභාවේ බහුතර එකඟතාවය මත අනුමත වූ යෝජනාවක් ලෙසට සභාපතිතුමා විසින් ප්‍රකාශයට පත් කරන ලදී.

**යෝජනා අංක II:-**

"සාමාජික ප්‍රවර්ධනය පිණිස නව සාමාජිකයින් හඳුන්වාදීම වෙනුවෙන් සාමාජිකයෙකුට ගෙවන රු.100/= ක දීමනාව රු.500/= දක්වා වැඩි කිරීමට යෝජනා කරමු."

මෙහිදි සාමාජික උපුල් ප්‍රියලාල් අධිකාරි මහතා විසින් (සා.අං 21123) රු.500/= ක් අයකරනු ලබන්නේ කාගෙන්ද යන්න සම්බන්ධයෙන් ප්‍රශ්න කරන ලදී. මෙම යෝජනාවේ අරමුණ සාමාජිකත්ව ප්‍රවර්ධනය නම් සංගමය විසින් මෙම මුදල ගෙවීම් කිරීම ගැටළු සහගත බවට පෙන්වා දෙන ලදී.

අතීතයේදී සාමාජිකයින් විසින් ස්වකැමැත්තෙන්ම නොමිලේ ප්‍රවර්ධන කටයුතු සිදුකර ඇති හෙයින් සාමාජිකයින්ගෙන් එම මුදල් අය නොකරන ලෙසට ප්‍රකාශ කරන ලදී. නව සාමාජිකයින්ගෙන් මෙම මුදල අය කළහොත් එය ගැටලුකාරි තත්වයක් බවට පත්වීමට ඉඩ ඇති හෙයින් පවත්නා ක්‍රමවේදයම තවදුරටත් ක්‍රියාත්මක කිරීම සුදුසු බැවින් මෙම යෝජනාව සම්මත කර නොගන්නා ලෙස ඒ මහතා විසින් තවදුරටත් ප්‍රකාශ කරන ලදී.

එමෙන්ම සාමාජික ඩී.පී. සමරසිංහ මහතා ද (සා.අංක 16079) මෙම යෝජනාවට අකැමැත්ත පළ කරමින් රු.100/= ක දීමනාව තවදුරටත් ප්‍රමාණවත් බව දැනුම් දෙන ලදී.

ඒ අනුව මෙම යෝජනාව සඳහා සභාවේ එකඟතාවය නොලැබුණු අතර පවත්නා ක්‍රමවේදයම ඉදිරියටත් අනුගමනය කිරීමට තීරණය කරන ලදී.

මෙම යෝජනාව අනුමත නොවූ යෝජනාවක් ලෙසට සභාපතිතුමා විසින් ප්‍රකාශයට පත් කරන ලදී.

**නිල යෝජනා අංක III**

"සංගමයේ සාමාජිකයින් වෙත ලබා දෙන රන් භාණ්ඩ උකස් ණය රු.50,000/= ක උපරිමයක් දක්වා වූ ණය මුදල කාර්ය මණ්ඩලයේ සේවකයින් හටද සාමාජිකයින්ට ලබා දෙන කොන්දේසි යටතේම ලබා දීමට යෝජනා කරමු."
මෙම යෝජනාව සම්බන්ධයෙන් කේ.ඩී.බී. පෙරේරා මහත්මිය (සා.අංක 13096) නැඟී සිට එකඟතාවය පල කල අතර සභාපතිතුමා විසින් සභාවේ එකඟතාවය විමසන ලදි. එහිදි සියළුම දෙනා අත් ඔසවා එම යෝජනාවට එකඟතාවය පල කල හෙයින් මෙම නිල යෝජනාව සම්මත වූ යෝජනාවක් වශයෙන් පිලිගන්නා ලදි.

ඒ අනුව මෙම යෝජනාව ඒකච්ඡන්දයෙන් අනුමත වු යෝජනාවක් ලෙසට සභාපතිතුමා විසින් ප්‍රකාශයට පත් කරන ලදී.

**මෙම අවස්ථාවේදී සභාපති විසින් ඒ වන විට පැමිණි සිටි පිරිස 350 ක් බව සභාවට ප්‍රකාශ කරන ලදී. (පෙ.ව 9.30 වන විට)**

**නිලයෝජනා අංක IV**

"138 වාර්ෂික මහා සභා රැස්වීමේදී " වාර්ෂික වාර්තාව අවශ්‍ය සාමාජිකයින්ට මුද්‍රිත පිටපත් ලබා ගත හැකි වන සේ නිල වෙබ් අඩවියේ පළ කිරීමට" නිලයෝජනාවක් අනුමත වූවත් වෙබ් පිටුව යාවත්කාලීන වී නොමැති බැවින් සහ අවශ්‍ය සාමාජිකයින් කවුරුන් ද යන්න නිශ්චිත නොමැති බැවින් 140 වාර්ෂික වාර්තාවේ මුද්‍රිත පිටපත් මෙවර සියලු සාමාජිකයින්ට ලබා දීමට 2024.07.11 දින පැවති කළමනාකරණ කමිටුව තීරණය කරන ලද අතර ඉදිරි වර්ෂයේ සිට සාමාජික ඔබගේ ඉල්ලීම පරිදි පමණක් මුද්‍රිත පිටපත් ලබා දීමට යෝජනා කරමු."

ඉදිරි වර්ෂයේ සිට සාමාජිකයින්ගේ ඉල්ලීම පරිදි මහ සභා වාර්තාවේ මුද්‍රිත පිටපත් ලබාදීමටත් එම වාර්තාව වෙබ් පිටුවට ඇතුලත් කිරීමටත් සභාවේ බහුතර එකඟතාවය ලැබුන හෙයින් මෙම නිල යෝජනාව අනුමත වූ යෝජනාවක් ලෙස සලකන ලදි.

මෙම යෝජනාව සභාවේ බහුතර එකඟතාවය මත අනුමත වූ යෝජනාවක් ලෙසට සභාපතිතුමා විසින් ප්‍රකාශයට පත් කරන ලදී.

**නිල යෝජනා අංක V**

"වර්තමාන වෙළඳපළ මිල ගණන් ඉහළ යාම හේතුවෙන් ප්‍රාග්ධන හා ප්‍රාග්ධන නොවන භාණ්ඩ මිලදී ගැනීමට ඒකාබද්ධ ලේකම් හා භාණ්ඩාගාරිකට තිබූ රු.10,000.00 දක්වා වූ අනුමත සීමාව රු.20,000.00 දක්වා ද, සභාපතිවරයාට තිබූ රු.50,000.00 ක් දක්වා වූ අනුමත සීමාව රු.100,000.00 දක්වා ද, වැඩි කිරීමට යෝජනා කරමු. ( රු.100,000.00 වැඩි සියලුම මිලදී ගැනීම් සඳහා කළමනාකරණ කමිටුවේ අනුමැතිය ලබා ගත යුතුය.)"

වර්තමාන වෙළඳපල මිල ගණන් ඉහල යාම හේතුවෙන් ප්‍රාග්ධන හා ප්‍රාග්ධන නොවන භාණ්ඩ මිලදී ගැනීම සඳහා ඉදිරිපත් කර තිබූ මෙම යෝජනාවට එස්. කුගදාසන් මහතා (සා.අං.13151) විසින් පළමුවෙන්ම නැඟී සිටිමින් සිය එකඟතාවය පළ කරන ලදි.

ඉන් අනතුරුව අයි.සී. ගමගේ මහතා (සා.අංක 28697) විසින්, ඒකාබද්ධ ලේකම් හා භාණ්ඩාගාරික හට ඇති වියදම් සීමාව ඉහල දැමීම (රු.10,000 සිට රු.20,000) සම්බන්ධයෙන් සිය එකඟතාවය පළ කල අතර සංගමයේ සභාපති හට යෝජනා කර ඇති පරිදි රු.50,000 සිට රු. 100,000 දක්වා වූ වැඩි කිරීමේ සීමාව එක්වරම රු.100,000 දක්වා ඉහල නොදමන ලෙසටත් මුල් අවස්ථාවේදී එම සීමාව රු.75,000.00 දක්වා වැඩිකිරීම සුදුසු බවටත් ප්‍රකාශ කරන ලදී.

කේ.ඩී.බී. පෙරේරා මහත්මිය (සා.අංක 13096) විසින් ද සභාපති හට වියදම් කළ හැකි සීමාව රු.100,000 නොව රු.75,000 ට සීමා කිරීම සුදුසු බව යෝජනා කරන ලදී.
මේ සම්බන්ධයෙන් තවදුරටත් අදහස් ඉදිරිපත් කරමින් සාමාජික පී .ජී .එස්. සමරක්කොඩි මහතා (සා.අංක25299) විසින් පවතින වෙළඳපල තත්ත්වයන් හා සංගමයේ කාර්ය ප්‍රමාණයන් වලට සමගාමීව මෙම යෝජනාව ඉතාමත්ම ප්‍රායෝගික බවත් සංගමයේ කටයුතු පවත්වාගෙන යාමේ පහසුව සඳහාත් මෙම යෝජනාවෙන් වියදම් කිරීමට බලය දීමක් පමණක් සිදුකරන හෙයිනුත් ඒකාබද්ධ ලේකම් හා භාණ්ඩාගාරික හට රු.10,000 සිට රු. 20,000 දක්වා වියදමට බලය දිමේ සීමාව වැඩිකිරීමත් සභාපති හට එම සීමාව රු.50,000 සිට රු.100,000 දක්වා වැඩි කිරීමත් සුදුසු බව සභාව වෙත පැහැදිලි කර දෙන ලදි.

ඒ අනුව පළමු යෝජනාවට (රු.10,000 සිට රු.20,000 දක්වා වැඩි කිරීමට) සභාවේ එකඟතාවය ලැබී ඇති බව පෙනී ගිය නිසාද සභාපති හට වියදම් කිරීමට බලය දීමේ සීමාව 50,000 සිට රු.75,000 දක්වා වැඩි කරන්නේ ද නැතහොත් රු.50,000 සිට රු.100,000 දක්වා වැඩි කරන්නේ ද යන්න පිලිබඳව තීරණයකට එළඹිය යුතු හෙයින් සභාවෙන් ඡන්ද විමසීමක් සිදු කිරීමට සභාපතිතුමා විසින් පියවර ගන්නා ලදී. එහිදි රු. 50,000 සිට රු.100,000 දක්වා වැඩි කිරීමේ යෝජනාවට සභාවේ බහුතර එකඟතාවය ලැබුණු හෙයින් සභාපති හට හිමිවන වියදම් කිරීමට බලය දීමේ සීමාව රු. 50,000 සිට රු.100,000 දක්වා ඉහල දැමීමට තීරණය කරන ලදි.

ඒ අනුව මෙම යෝජනාව සභාවේ බහුතර එකඟතාවය මත සම්මත වූ යෝජනාවක් ලෙසට සභාපතිතුමා විසින් ප්‍රකාශයට පත් කරන ලදී.

**08.කටුකැලියාව නිවාඩු නිකේතනයේ බංගලා භාරකරු බඳවා ගැනීම සඳහා වූ බඳවා ගැනීමේ පරිපාටිය සම්බන්ධයෙන් සාකච්ඡා කිරීම.**

බංගලා භාරකරු බඳවා ගැනීමට අදාල බඳවා ගැනීමේ පරිපාටිය සම්මත කිරීම සඳහා මෙවර මහ සභාවට ඉදිරිපත් කර නොතිබීම සම්බන්ධයෙන් සාමාජික අයි.සී.ගමගේ මහතා (සා.අංක 28697) විසින් ප්‍රශ්න කරන ලදි.

137/138 මහ සභාවේදී බඳවා ගැනීමේ පරිපාටියක් ඉදිරිපත් කර තිබූ නමුත් එදින එය සම්මත නොවීම හේතුවෙන් නැවත බඳවා ගැනීමේ පරිපාටියක් සකස් කොට කමිටු සාකච්ඡාවට ඉදිරිපත් කිරීම සඳහා තමා ඇතුලු තවත් සාමාජිකයින් කීපදෙනෙකුගෙන් යුතු කමිටුවක් එදින මහ සභාවේදී පත්කල බවත් එම කමිටුව විසින් බඳවා ගැනීමේ පරිපාටියක් සකස් කොට කළමනාකරණ කමිටුව වෙත ඉදිරිපත් කල බවත් තවදුරටත් එම මහතා විසින් දන්වා සිටින ලදි.

එසේ ඉදිරිපත් කල බඳවාගැනීමේ පරිපාටිය කළමනාකරණ කමිටුව විසින් අනුමත කල බව සභාපතිතුමා විසින් දැනුම් දෙන ලදි.

එහිදී තවදුරටත් අදහස් දක්වමින් අයි.සී.ගමගේ (සා.අංක 28697) මහතා විසින් කළමනාකරණ කමිටුවේ අනුමැතියෙන් පමණක් බඳවා ගැනීමේ පරිපාටියක් ක්‍රියාත්මක කල නොහැකි බවත් එය මහ සභාවට ඉදිරිපත් කර සම්මත කර ගැනීමෙන් පසුව ක්‍රියාත්මක කලයුතු බව පනතේ සදහන්ව තිබියදීත් මෙවර එම බඳවා ගැනීමේ පරිපාටිය නිල යෝජනාවක් වශයෙන් ඉදිරිපත් නොකිරීමට හේතුව විමසන ලදි.

මේ සම්බන්ධයෙන් අදහස් දක්වමින් ඩී.එම්.දයානී දිසානායක මහත්මිය (සා.අංක16767) දන්වා සිටියේ මෙම ආයතනය නීතියේ ආධිපත්‍යයට යටත්ව නීතිය රැකගනිමින් කටයුතු කල යුතුව ඇති බවයි.

මේ සම්බන්ධයෙන් පී.ජී.එස්.සමරක්කොඩි මහතා (සා.අංක 25299) විසින් අදහස් පල කරමින් දැනට මෙම නිවාඩු නිකේතනය නඩත්තු කිරීම සඳහා විශාල වැය බරක් දැරීමට සිදුවන හෙයින් එහි ආදායම ඉහල නැංවීම සඳහා වැඩපිළිවෙලක් සකස් කල යුතුව ඇති බවත් බංගලා භාරකරු තනතුරට දැනට තාවකාලිකව පුද්ගලයෙකු බඳවාගෙන තිබීම හේතුවෙන් එවන් වැඩපිළිවෙලවල් ද සංවිධානය කිරීමට නොහැකි වී තිබීම හේතුවෙන් කඩිනමින් විධිමත් පරිදි බඳවාගැනීම් පරිපාටියකට අනුව මෙම තනතුරට අයෙකු බඳවා ගැනීමට අවශ්‍ය හෙයින් මෙම බඳවා ගැනීමේ පරිපාටිය මහ සභාවේදී සම්මත කරගැනීමේ අවශ්‍යතාවය තවදුරටත් අවධාරණය කරන ලදි.

ඒ අනුව මෙම බඳවා ගැනීමේ පරිපාටිය මෙවර සභාවට ඉදිරිපත් කර නොමැති හෙයින් ඊලග මහා සභාවට ඉදිරිපත් කරන බව සංගමයේ සභාපතිතුමා විසින් ප්‍රකාශ කරන ලදි.

එහිදී අදහස් දක්වමින් අයි.සී. ගමගේ මහතා (සා.අංක 28697) විසින් යෝජනා කරන ලද්දේ යම් හෙයකින් දැනට නිත්‍යානුකූල පදනමක් නොමැතිව තාවකාලිකව බඳවාගෙන සිටින මෙම බංගලා භාරකරු විසින් ඔහුට සිදුවූ අගතියක් සම්බන්ධයෙන් සංගමයට එරෙහිව නීති ක්‍රියාමාර්ගයක් ගතහොත් දැරීමට සිදුවන කිසිදු ආකාරයේ වියදමකට සංගමයේ සාමාජිකත්වය ඒ සඳහා වගකිවයුතු නොවන බවත් එවන් අවස්ථාවක් සිදුවුවහොත් එහි සම්පූර්ණ වගකීම කළමනාකරණ කමිටුව විසින් භාරගත යුතු බව යෝජනා කරන ලදි.

මෙම යෝජනාව සාමාජික ඩී.ඩී.පී.දිසානායක මයා(සා.අං 31054) විසින් ස්ථිර කරන ලදි.

**09.2024/2025 වසර සඳහා නිලවරණය පැවැත්වෙන ආකාරය පිළිබඳව හඳුන්වා දීම.**

මෙවර නිලවරණය මෙහෙය වීමේ කටයුතු මුදල් අමාත්‍යංශයෙන් පත් කල අධ්‍යක්ෂ එම්.ඒ.කරුණාරත්න මහතාට පවරා තිබූ අතර ඒ මහතා විසින් නිලවරණය පැවැත්වෙන ආකාරය පිළිබඳව විස්තරාත්මකව කරුණු දැක්වීමක් සිදු කරන ලදි.

**10. 2024/2025 නිලවරණය සඳහා නාමයෝජනා ඉදිරිපත් කර ඇති සාමාජික සාමාජිකාවන් හඳුන්වා දීම.**

භාණ්ඩාගාර නියෝජිත ඩබ්.ඒ.එස්.ඉරෝෂන් මහතා විසින් මෙවර නිලවරණය සඳහා ඉදිරිපත් වන අපේක්ෂකයින් කවුරුන්ද පිළිබඳව ප්‍රකාශයට පත් කළ අතර, අපේක්ෂකයින් හට තමන්ව හඳුන්වාදීම සඳහා අවස්ථාව ලබා දෙන ලදී. අපේක්ෂක නාම ලේඛනය පහත සඳහන් කර ඇත.

| ඡන්ද පත්‍රිකාවේ සඳහන් අංකය | අපේක්ෂකයාගේ නම සහ සේවා ස්ථානය |
|---|---|
| 01 | අතුරලිය වෙළඳගොඩගේ ඉරේෂා ප්‍රසාදනී අතුරලිය මිය- (ශ්‍රී ලංකා රේගු දෙපාර්තමේන්තුවකොළඹ 01) |
| 02 | ඇත්මඩලගේ සනත් සුරංග පෙරේරාමයා(ක්‍රිස්තියානි ආගමික කටයුතු දෙපාර්තමේන්තුවකොළඹ 10) |
| 03 | ඉඩමේ හේරත් මුදියන්සේලාගේ මංගලිකා පුෂ්පකුමාරිමිය- (අධිකරණ බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යංශය -කොළඹ 10) |
| 04 | ඉමදූව විතානගේ අනුලාමිය- (විශ්‍රාමික) |
| 05 | එදිරිසිංහ ආරච්චිගේ ගාමිණී සරත් පෙරේරාමයා-(විශ්‍රාමික) |
| 06 | කලංසූරියගේ නමුණු දර්ශිකා ජයසුන්දරමිය- (රාජ්‍ය පරිපාලන අමාත්‍යංශය-කොළඹ 07) |
| 07 | කාරියවසම් තෙලිකඩ ගමගේ ශ්‍යාමලී කාරියවසම්මිය-(ශ්‍රී ලංකා දන්ත වෛද්‍ය ශික්ෂණ රෝහල -කොළඹ 07) |

| | |
|---|---|
| **08** | කුලප්පු තන්ත්‍රිගේ නාමලී රසිකාමිය-(රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව -කොළඹ 05) |
| **09** | ගංගොඩ වත්තේ ජයලත් සමන් කුමාරමයා-(අධිකරණ බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය -කොළඹ 10) |
| **10** | ජයවීර ආරච්චිලාගේ ජනක සංජීව රුවන් කුමාර මයා- (සංචාරක හා ඉඩම් අමාත්‍යාංශය-කොළඹ 10) |
| **11** | ජයසිංහ ආරච්චිගේ රසික නාමල් ජයසිංහමයා - (ජාතික රෝහල -කොළඹ 10) |
| **12** | තෙබුවන ආරච්චිගේ බුද්ධදාස මයා- (විශ්‍රාමික) |
| **13** | දිලිනි අසෝකාජයවර්ධන මිය- (මුදල් අමාත්‍යාංශය කොළඹ 01) |
| **14** | දිසානායක මුදියන්සේලාගේ දයානී දිසානායකමිය- (විශ්‍රාමික) |
| **15** | දොන් ප්‍රේමචන්ද්‍ර සමරසිංහමයා- (විශ්‍රාමික) |
| **16** | පහල ගෙදර විජේසිංහමයා- (රිජ්වේ ආර්යා ළමා රෝහල කොළඹ 08) |
| **17** | පොන්නම්පෙරුම ආරච්චි ගනීෂ ගයම්පත්මයා- (වාරිමාර්ග දෙපාර්තමේන්තුව -කොළඹ 07) |
| **18** | බුද්ධිකවිජේසිංහමයා- (මිනින්දෝරු දෙපාර්තමේන්තුව- කොළඹ 05) |
| **19** | මාගලගේ ස්වර්ණා මංගලිකා පෙරේරාමිය-(ක්‍රීඩා හා යෞවන කටයුතු අමාත්‍යාංශය කොළඹ 07) |
| **20** | රංගොඩ හෙට්ටිආරච්චිගේ සේනක පෙරේරා මයා- (විශ්‍රාමික) |
| **21** | රයිගම් කෝරලලාගේ අනුර වීරසිරි මයා- (විශ්‍රාමික) |
| **22** | ලියනගේ අභයවර්ධන මයා- (විශ්‍රාමික) |
| **23** | වැලිවිට ලියන ආරච්චිල්ලාගේ හරින්ද්‍ර වැලිවිට මයා- (විශ්‍රාමික) |
| **24** | වැලිවිටි ගොඩගේ සුනිල් පුෂ්ප කුමාරමයා -(ධීවරඅමාත්‍යාංශය -කොළඹ 10) |
| **25** | ෂර්ලි ස්ටැන්ලිඇලෝසියස් මයා-(දේශිය ආදායම් දෙපාර්තමේන්තුව -කොළඹ 05) |
| **26** | හෙට්ටි ආරච්චිගේ සමන්තමයා-(ශ්‍රී ලංකා දුම්රිය මූලස්ථානය -කොළඹ 10) |
| **27** | හෙන්දා විතාරණගේ කරුණාදාස මයා-(විශ්‍රාමික) |

**<u>11. නිලවරණය ආරම්භ කිරීම.</u>**

පෙ.ව.10.30 ට පමණ නිලවරණය ආරම්භ කරන බව සංගමයේ සභාපතිතුමා විසින් ප්‍රකාශයට පත් කරන ලදි.

**<u>12. 2023.08.19 වන දින පවත්වන ලද 139 වන වාර්ෂික මහා සභා රැස්වීම් වාර්තාව සාකච්ඡා කිරීම හා සම්මත කිරීම.</u>**

මේ සම්බන්ධයෙන් පහත සදහන් පරිදි සාමාජිකයින් විසින් සිය අදහස් එල කරන ලදි.

1) **එච්.එම්.එල් කාන්ති මිය - සා.අංක 24061**
තමා විසින් පසුගිය සභාවාරයේදී දිරිය ණය සම්බන්ධයෙන් පල කරන ලද අදහස මෙවර වාර්තාවට ඇතුලත් නොවීම සම්බන්ධයෙන් ප්‍රශ්න කරන ලද අතර, මෙතෙක් තමා හට වාර්තාවේ පිටපතක් ලැබී නොමැති බවත් දැනුම් දෙන ලදි.

එහිදී සභාපතිතුමා විසින් එම සාමාජික මහත්මියගේ ප්‍රකාශය 140 වන මහ සභා වාර්තාවේ 25 වන පිටුවට ඇතුලත් කර ඇති බව පෙන්වා දෙන ලදී. එමෙන්ම කාර්යාලීය නිලධාරීන් විසින් දුරකතනයෙන් මේ සම්බන්ධයෙන් එම මහත්මිය හට දැනුම් දී ඇති බව සභාපතිතුමා විසින් ප්‍රකාශ කළ අතර පොරොත්තු ලේඛනයට අනුව ඇය හට දිරිය ණය ලබාදීමට හැකියාවක් පවතින බවත් සභාපතිතුමා විසින් තවදුරටත් දන්වා සිටින ලදී.

**2) අයි.සී.ගමගේ මහතා - සා.අංක 28697**

ලේකම්වරයකු විසින් ඉදිරිපත් කල යුතු වාර්තාවක් සභාපති විසින් ඉදිරිපත් කර තිබීම සම්බන්ධයෙන් විමසන ලදි.

ඒ අවස්ථාවේදී සංගමයේ සභාපතිතුමා විසින් හිටපු ඒකාබද්ධ ලේකම් හා භාණ්ඩාගාරික විසින් ලබාදී තිබූ වාර්තාවේ සඳහන්ව තිබූ කරුණු සහ එදින රැස්වීමේ හඬපටයේ පටිගත වී තිබූ කරුණු අතර පරස්පරතා පැවති හෙයින් එය නිවැරදි කර දෙන ලෙසට හිටපු ඒකාබද්ධ ලේකම් හා භාණ්ඩාගාරික හට අවස්ථා කිහිපයකදීම ලිඛිතව, Whatsapp පණිවිඩ මඟින් සහ දුරකතනය මඟින් දැනුම්දුන් නමුත් ඒ මහතා විසින් එය සකස් කර නොදුන් හෙයින් මහා සභාවට නිවැරදි වාර්තාවක් වගකීමෙන් යුතුව ඉදිරිපත් කළ යුතුව ඇති නිසා කළමනාකරණ කමිටු සාමාජිකයින් හා එක්ව මෙම වාර්තාව සකසා සභාවට ඉදිරිපත් කළ බව දන්වා සිටින ලදී.

තවද ඒ අයි.සී.ගමගේ මහතා (සා.අංක 28697) විසින් තවදුරටත් අදහස් දක්වමින් ගණකාධිකාරි තනතුර පිළිබඳව ගැටලු පවතින බැවින් ඒ සම්බන්ධව විමසා බැලීමට පත් කළ කමිටු වාර්තාව මෙවර ඉදිරිපත් කර නොමැති හෙයින් ඊළඟ මහා සභාවට ඉදිරිපත් කළ යුතු බව දන්වා සිටින ලදී.

එය ඉදිරිපත් කළ හැකි බව සභාපතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

**3) ජේ.ඒ.ආර්.එන්.ජයසිංහ මහතා - සා.අංක 24020**

මෙහිදි අදහස් දක්වමින් සාමාජික නාමල් ජයසිංහ මහතා විසින් ලේකම්වරයා විසින් ලබා දෙන ලද අඩුපාඩු සහිත වාර්තාව ඒ අයුරින්ම ඉදිරිපත් නොකර කමිටුවක් වශයෙන් වගකීමකින් යුතුව එදිනට හඬපටයේ පටිගතව ඇති නිවැරදි තොරතුරු සඳහන් කරමින් මෙම වාර්තාව ඉදිරිපත් කළ බව දන්වා සිටින ලදී.

**4) ඩී.එම්.ඩී.දිසානායක මිය - සා.අංක16767**

මෙම අවස්ථාවේදී සාමාජික ඩී.එම්.ඩී.දිසානායක මිය විසින් සිය අදහස් පළකරමින් 1891 අංක 05 හා සංශෝධිත 474 වන අධිකාරිය වන රාජ්‍ය සේවා අන්‍යොන්‍යාධාර අර්ථසාධක සංගම් ආඥාපනතේ 30 වැනි වගන්තිය ප්‍රකාරව මතභේදාත්මක අවස්ථාවකදී බේරුම්කරුවා වන්නේ භාණ්ඩාගාර ලේකම්වරයා වන්නේය යන බව ප්‍රකාශ කරන ලද අතර සංගමයේ ලේකම්වරයා විසින් අත්සන් නොකරන ලද වාර්තාවක් සභාගත කරන්නේ කෙසේද යන්න විමසන ලදී.

තවද තමා සහ අනෙකුත් අය විසින් පසුගිය සභාවාරයේදී ඉදිරිපත් කරන ලද පෞද්ගලික යෝජනා සම්බන්ධයෙන් පත්වන කළමනාකරණ කමිටුවේදී සාකච්ඡා කර තීරණයක් ගන්නා ලෙසට සා.අං 15301 දරණ ඩී.එල්.තිලකරත්න මහතා විසින් යෝජනා කර ඇති බව සඳහන් කළද ඒ අනුව කටයුතු කළේ නම් එම කමිටු තීරණ මොනවාද යන්න ඉදිරිපත් කරන ලෙසත් දන්වා සිටින ලදි.

එහිදි භාණ්ඩාගාර නියෝජිත ඩබ්.ඒ.එස්.ඉරෝෂන් මහතා අදහස් දක්වමින් සංකීර්ණ ගැටලු සම්බන්ධයෙන් කෙටි කාලයක් තුළ විසඳුම් දීමට අපහසු බැවින් ඒ සම්බන්ධයෙන් සාකච්ඡා කර තීරණයක් ලබා දිය යුතුව ඇති බව ප්‍රකාශ කරන ලදී.

එමෙන්ම මෙම වාර්තාව නිවැරදිව හා වගකීමකින් යුතුව සාමාජිකයින්ගේ ගෞරවය ද රැකෙන පරිදි ඉදිරිපත් කිරීමට කළමනාකරණ කමිටුවක් විසින් ගත් වෑයම පිළිබඳව ද සභාවට කරුණු තහවුරු කරදීමෙන් අනතුරුව මෙම වාර්තාව සම්පූර්ණ කර අනුමත කිරීමට ඉඩදීම සුදුසු බව අයි.සී.ගමගේ මහතා විසින් ප්‍රකාශයට පත් කරන ලදී.

කාලවේලාව ඉක්මවා යන හෙයින් මෙම වාර්තාව නිවැරදි වාර්තාවක් බවට එස්. කුගදාසන් මහතා (සා.අංක 13151) විසින් යෝජනා කළ අතර පී.ඒ.ජී.ගයම්පත් මහතා (සා.අංක 26120) විසින් ස්ථිර කිරීමෙන් පසුව මෙම වාර්තාව සම්මත විය.

**13. 2023.12.31 න් අවසන් වර්ෂය සඳහා 140 වන කළමනාකරණ වාර්තාව හා 2023 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ සාකච්ඡා කිරීම හා අනුමත කිරීම.**

මෙහිදී අදහස් දක්වමින් සා.අංක 13151 එස්.කුගදාසන් මහතා විසින් සංගමයේ සතු මුළු වත්කම් ප්‍රමාණය පිළිබඳව සලකා බැලීමේදි මේ වන විට ප්‍රශස්ත ඉලක්කයක් සපුරා ගෙන තිබීම සම්බන්ධයෙන් ගණකාධිකාරි ඇතුළු කාර්ය මණ්ඩලය වෙත සිය ප්‍රසාදය පළ කරන ලදී.

එමෙන්ම ඒකාබද්ධ ලේකම් හා භාණ්ඩාගාරික තනතුරේ දායකත්වය මීට වඩා ඉහළ මට්ටමක පැවතිය යුතු බව අවධාරණය කළ අතර අභ්‍යන්තර විගණනයේ පවතින අඩුපාඩු තවදුරටත් සකස්කර ගත යුතු බවට දැනුම් දෙන ලදී.

ඒ සම්බන්ධයෙන් සංගමයේ සභාපති විසින් ද අදහස් පලකරමින් අභ්‍යන්තර විගණන ක්‍රමවේදය හා එම විෂය සම්බන්ධයෙන් විෂය අවබෝධය ඇති අය බඳවා ගැනීම සඳහා ඉදිරි බඳවා ගැනීම් වලදී විශේෂ අවධානය යොමු කිරීමට කටයුතු කරන බවත් දැනට සිටින නිලධාරින් හට ඒ සම්බන්ධයෙන් අවශ්‍ය පුහුණුවීම් ලබා දීමට අවශ්‍ය කටයුතු සිදුකරන බවත් සභාවට දැනුම් දෙන ලදී.

තවද මෙවර අවසන් ගිණුම් පිළියෙල කිරීමේදී සාමාජිකයින්ට ගෙවනු ලබන ලාභාංශය ද වියදමක් සේ සලකා ගිණුම්ගත කර ඇති බවත් මින් ඉදිරියටත් එම ක්‍රමවේදය අනුගමනය කිරීමට කටයුතු කරන බවත් සභාපතිතුමා විසින් සභාවට දැනුම් දුන් අතර මෙවර විගණකාධිපති විසින් සංගමයේ අවසන් ගිණුම් වාර්තාව සම්බන්ධයෙන් සත්‍ය හා සාධාරණ මතයක් පළ කර ඇති බවත් ප්‍රකාශ කරන ලදී.

ඒ.එම්.යූ.පී.අධිකාරි මහතා (සා.අංක 21123) විසින් ද මේ සම්බන්ධයෙන් අදහස් දක්වමින් මූල්‍ය වාර්තාව නිවැරදිව සකස් කිරීම පිළිබඳව ස්තුතිය පළ කළ අතර නව සාමාජිකයින් හට නිවාස හා දේපළ ණය ලබා දීමේදී සාමාජිකත්ව කාලය වසර 03 ක් ලෙස නොසලකන ලෙසත් අනෙකුත් ණය ලබා ගැනීමේදී නව සාමාජිකයින්ගේ සාමාජිකත්ව කාලය මත ණය ලබා ගැනීමට ඇති හැකියාව අඩු නොකරන ලෙසත් ප්‍රකාශ කරන ලදී.

ඒ අනුව 2023 වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන වාර්තාව සම්මත කිරීමේ යෝජනාව එන්.ජී.කේ.කේ.සෙනවිරත්න මහතා (සා.අංක 16635) විසින් සිදුකළ අතර ඩී.හේමන්ත විජේතිලක මහතා (සා.අංක 16704) විසින් ස්ථිර කිරීමෙන් අනතුරුව සභා සම්මත විය.

**14. 2023 වර්ෂය සඳහා සාමාජිකයින් වෙනුවෙන් ප්‍රකාශිත පොලිය හා කාර්යමණ්ඩලයට ප්‍රසාද දීමනා ගෙවීම පිළිබඳව සාකච්ඡා කිරීම හා අනුමත කිරීම.**

සාමාජිකයින් හට 6% ක ලාභාංශයක් හා කාර්ය මණ්ඩලයට මාසික මූලික වැටුපෙන් 1.5 ක ප්‍රමාණයක ප්‍රතිශතයක් ප්‍රසාද දීමනා වශයෙන් ලබාදීමට සුදුසු බව ඩී.එම්.ඩී.දිසානායක මහත්මිය (සා.අංක16767) විසින් යෝජනා කළ අතර කේ.ඩී.බී.පෙරේරා මහත්මිය (සා.අංක13096) විසින් ස්ථිර කරන ලදී.

**15. නියමිත දිනට දැනුම්දීමක් කර ඇති පෞද්ගලික යෝජනා ඉදිරිපත් කිරීම.**

**1. කේ.ඩී.බී.පෙරේරා මිය- සා.අංක 13096**

**සංගම් ආඥාපනතේ ව්‍යවස්ථාවලියේ රීතියට ඇතුළත් කර ගැනීම පිණිස.**

සංගමයේ කළමනාකරණ කටයුතු සඳහා තනතුරු 02 ක් ආරම්භ වූයේ,

1984 ජුනි මස 16 වන දින සංගමයට 100 වන ශතවර්ෂය පිරීම නිමිත්තෙන් කොළඹ ආනන්ද විද්‍යාලීය කුලරත්න ශ්‍රවනාගාරයේ පැවති මහා සභා රැස්වීමේදීය.

1988 වන කාලය තුළ ඒකාබද්ධ ලේකම් හා භාණ්ඩාගාරික තනතුර දැරූ පුද්ගලයා සංගමයේ සාමාජිකයෙකු නොවීය.

ඔහු සංගමයේ රාජකාරියට අමතරව අතිරේකව පෞද්ගලික වැඩවල යෙදීම නිසා ඔහුට විරුද්ධව ඇතිවූ චෝදනා නිසා සංගමයේ සාමාජිකත්වය නොමැති අය මෙම තනතුරට පත් කිරීම් නොකළ යුතු බවට යෝජනාවක් 1988/89 මහා සභා රැස්වීමේදී ඒකඡන්දයෙන් සම්මත කර ගන්නා ලදී.

ඉන්පසුව කලක්ම සාමාජිකත්වය ඇති අයම මෙම තනතුරට පත්කර ගන්නා ලදී.
නැවත 2004 දී සභාපති වශයෙන් පැමිණි මල්ලිකාරච්චි මහතා තම කිට්ටුවන්ත මිත්‍රයෙකුට (සාමාජිකත්වයක්) නොමැති අයෙකු සහකාර ලේකම් තනතුරට පත් කර ගන්නා ලදී. මේ කාලය තුලද විශාල මූල්‍ය විනාශයක් සිදුවිය.
නැවත 2021/2022 කාලය තුල සාමාජිකත්වය නොමැති මහත්මයෙකු ඒකාබද්ධ ලේකම් හා භාණ්ඩාගාරික තනතුරට පත්කර ගන්නා ලදී.
ඔහුගේ සේවා කාලය 2023 නොවැම්බර් මස අවසන් විය. තවත් මස 02 ක් ජනවාරි මස දක්වා දීර්ඝ කරන ලදී.
සුදුසුකම් මත තෝරාගත් පසු, සාමාජිකත්වය නොමැති වුවහොත්, ඔහුගේ /ඇයගේ වයස හා කැමැත්ත අනුව සාමාජිකත්වය දී පත්වීම දිය හැක.
මෙම යෝජනාව පැහැදිලි කිරීමේදී මේ තනතුරට ලැබෙන මූල්‍ය දීමනාව පැහැදිලි කරමි.
සංගම් ආඥා පනතේ ව්‍යවස්ථාවලියේ රීතියට ඇතුළත් කර ගැනීම සඳහා අද දින මහා සභාවෙන් සම්මත කරගන්නා ලෙස ඉතා ගෞරවයෙන් ඉල්ලා සිටින්නීය.

**කේ.ඩී.බී.පෙරේරා මහත්මිය (සා.අංක13096)** විසින් සංගමයේ ඒකාබද්ධ ලේකම් හා භාණ්ඩාගාරික සහ සහකාර ලේකම් තනතුරට සංගමයේ සාමාජිකත්වය නොමැති අය පත් නොකළ යුතු බවට රීතියක් සංගම් ආඥා පනතේ ව්‍යවස්ථාවලි රීතියට ඇතුළත් කර ගැනීම සඳහා ඉදිරිපත් කර ඇති යෝජනාව අයි.සී.ගමගේ මහතා (සා.අංක 28697) විසින් ස්ථිර කරන ලදී.

**2. ඩී.එම්.ඩී.දිසානායක මිය - සා.අංක 16767**

**<u>යෝජනා අංක : 01</u>**

නාමයෝජනා කැඳවීමේ නිවේදනය නිකුත් කිරීමේ නෛතික බලය ඇත්තේ සංගමයේ ඒකාබද්ධ ලේකම් හා භාණ්ඩාගාරිකවරයාටය.මෙවරද 140 වැනි වාර්ෂික මහා සභා රැස්වීමේ නිවේදනය සභාපතිවරයා විසින් නිකුත් කර ඇත. එය පනත අභිබවා කටයුතු කිරීමකි. අවභාවිතා කිරීමකි.

i) මේ නිසා මෙතැන් පටන්, පනත හා රීති ප්‍රකාර රැස්වීම් කැඳවීමේ නිවේදන නිකුත් කිරීම, නාමයෝජනා කැඳවීම, ලේකම් හා භාණ්ඩාගාරික විසින් සිදුකළ යුත්තේය.

ii) එසේම නාමයෝජනා කැඳවීමේ සිට සියලු නිලවරණ කටයුතු සංගමයේ විධායක නිලධාරින් දෙදෙනා වන ලේකම් හා සහකාර ලේකම්ගේ කර්තව්‍ය සභාපතිවරයා විසින් පමණක් අධීක්ෂණය කළ යුතුය. නිලවරණ අපේක්ෂකයින් වන පාලන කමිටු සාමාජිකයින් විසින් නිලවරණ පැවැත්වීම සඳහා පද්ධති හා සම්ප්‍රදාය වෙනස් කිරීම, ඡන්ද කූපන්පත් හා ටෝකන් පත්‍ර මුද්‍රණය කිරීම හා සැලසුම් කිරීම සම්බන්ධයෙන් වන කාර්යයන් සඳහා ඍජුව හෝ වක්‍රව දායකත්වය සැපයීම බලපෑම් ඇතිකිරීම සිදු නොකළ යුත්තේය.
III සංගමයේ ඉතිහාසය පුරාවට වසර 138 ක් පවත්වාගෙන ආ නිලවරණ අපේක්ෂක අංක ලබා දීම ඉංග්‍රිසි අක්ෂර අකාරාදී පිළිවෙල මින් ඉදිරියට ක්‍රියාත්මක විය යුත්තේය. එම සම්ප්‍රදායික ප්‍රතිපත්තියට කළමනාකරණ කමිටු තීරණ මත කිසිදු අගතියක්, වෙනසක් නොකළ යුත්තේය.

**<u>යෝජනා අංක : 02</u>**

යම් වංචා චෝදනාවක් සම්බන්ධයෙන් එම සාමාජිකයාට විරුද්ධව විනයානුකූල පරික්ෂණ සිදුවෙමින් පවතින විට හෝ චෝදනා ඔප්පු වී වරදකරුවෙකු බවට ඔප්පු වී ඇත්නම් එවැනි සාමාජිකයෙකු කළමනාකරණ කමිටුවේ සාමාජිකයෙකු ලෙස තරඟ කිරීමටද ධූර දැරීමටද නුසුදුස්සෙක් වන්නේය.

**<u>යෝජනා අංක : 03</u>**

1973 අංක 54 සංශෝධිත 474 අධිකාරියෙහි පනවා ඇති
4.a - භාණ්ඩාගාර ලේකම්වරයා විසින් පත්කරනු ලැබූ සභාපතිවරයා ශ්‍රී ලංකා පරිපාලන සේවයට අයත් නිලධාරියෙකුම විය යුතුය.

4.b - භාණ්ඩාගාර ලේකම්වරයා විසින් පත්කරනු ලබන නම්කළ කමිටු සභික දෙදෙනාගෙන් එක් අයෙකු ශ්‍රී ලංකා ගණකාධිකාරි සේවයේ නිලධාරියෙකු හා අනෙක් නිලධාරියාද ශ්‍රී ලංකා පරිපාලන සේවයට අයත් නිලධාරියෙකු විය යුතුය. (මෙය පනතට සංශෝධනයක් ලෙස ගෙන එනු ලබන්නේ මෑත කාලයක සිට එනම් වසර 12 ක් පමණ විවිධ අර්ථකථන යොදවමින් මුදල් අමාත්‍යාංශයේ නිලධාරින් අභිමතානුසාරීව කටයුතු කිරීම තුළින් සංගමයට අගතියක් සිදුවීම වලක්වාගනු පිණිසය)

**<u>යෝජනා අංක : 04</u>**
සංගමයේ සාමාජිකයින් විසින් බොහෝ සැකමුසු තැන් හා නිවැරදි කරගැනීම සඳහා ඉල්ලා සිටින තොරතුරු ලබානොදී වසන් කිරීම සහ පක්ෂග්‍රාහීව කටයුතු කිරීම වැනි ක්‍රියාකාරකම් සභාපතිවරයා ඇතුලු වත්මන් කළමනාකරණ කමිටුව විසින් බොහෝ අවස්ථාවල සිදුකර ඇත. සංගමය සාමාජිකයින්ගේ වන බැවින් 2016 අංක 12 දරණ තොරතුරු දැනගැනීමේ පනතේ විධිවිධාන මෙම ආයතනයටද බලගැන්වීම සිදුකල යුතු අතර සාමාජිකයින් විසින් ඉල්ලා සිටින තොරතුරක් සැපයීම සඳහා තොරතුරු නිලධාරියෙක් පත් කළ යුතුය. එම තනතුර නිල වශයෙන් සංගමයේ ලේකම් හා භාණ්ඩාගාරිකවරයා වෙත පැවරීම සුදුසු යැයි යෝජනා කරමි.

**<u>යෝජනා අංක : 05</u>**
වාර්ෂික මහා සභාවකදී අනුමත කරන යෝජනා පසුව රීති හා ව්‍යවස්ථා සංශෝධන බවට පත්වේ. සංගමය වසර 100 කටත් වඩා විරාත් කාලයක් පවතින්නේ එම නීතියේ පාලනයට යටත්ව ක්‍රියා කළ බැවිනි.
මහා සභා නිලවරණයෙන් තෝරා පත් කර ගන්නා පාලන කමිටුවේ ප්‍රධානතම හා න්‍යාය පත්‍රයේ අංක 01 ලෙස මෙතෙක් ක්‍රියාත්මක වූ පළමු කළමනාකරණ රැස්වීමේදී සිටම එම ක්‍රියාපිළිවෙල පසුගිය වසර 02 ක ධූර දැරූ පාලන කමිටුව ගමන් මල්ලේ ලා කටයුතු කර ඇත. මෙය සංගමයේ පැවැත්මට බලවත් තර්ජනයකි. එබැවින් මෙම යෝජනාව ශක්තිමත් කර නීතියක්/රීතියක් බවට බලගන්වන ලෙස මේ සභාවට යෝජනා කරමි.
" යම් වාර්ෂික මහා සභාවක් විසින් යෝජනා අනුමැතියකින් සම්මත වූ කාරණාවක් ඊළඟ මහා සභා රැස්වීමට ප්‍රථම නීතියක් බවට බලගැන්වීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම සභාපතිවරයාගේද, නම්කළ කමිටු සාමාජිකයින් දෙදෙනාගේද සහ ඡන්දයෙන් පත්වන කළමනාකරණ කමිටු සාමාජිකයින්ගේද වගකීම වන්නේය. එම වගකීම අත්හළ නොහැක්කේය. "

**<u>යෝජනා අංක : 06</u>**
I. 139 වැනි වාර්ෂික මහා සභා රැස්වීමේදී අනුමත කර පනවාගත් සියලුම නීති බලගැන්වීමට පාලන කමිටුව කටයුතු කළ යුත්තේය.
II. සංගමයේ කාර්ය මණ්ඩලයට අනුමත නොවූ තනතුරක් වන ගණකාධිකාරී තනතුර යටපත්කොට සංගමයට අත්‍යාවශ්‍ය තනතුරක් වන අභ්‍යන්තර විගණක තනතුරක් පිහිටුවීම හා බඳවා ගැනීමේ පටිපාටිය සකස් කිරීමටද සහ අනිසි ලෙස බඳවාගෙන ඇති " ගණකාධිකාරී " නිලධාරි තනතුර සංගමයේ ගිණුම් සහකාර ලෙස කටයුතු කළ අයෙකුට එකවරම පදනම් විරහිත ලෙස ගණකාධිකාරී තනතුරක් පිරිනමා උසස්වීමක් ලබාදී සංගමයට ඔරොත්තු නොදෙන විශාල වැටුප් හා දීමනා ලබා දීමට ගත් සමස්ත පද්ධතියම විමර්ශනය කිරීම සඳහා කළමනාකරණ කමිටුවෙන් පරිබාහිර විමර්ශන කමිටුවක් පිහිටුවා එම කර්තව්‍ය එම කමිටුවට භාරදිය යුතු යැයි යෝජනා කරමි.

මෙම ගණකාධිකාරී තනතුරට පත් කර ඇත්තේ එවක සහ වත්මන් කළමනාකරණ කමිටු සාමාජිකයෙකුගේ ඥාතියෙකු බවට කරුණු හෙලිදරව් වී ඇත. මහා සභාවේ අනුමැතියකින් තොරව සංගමයට තනතුරු ඇති කළ නොහැකි බව රීතිවල පැහැදිලිව සඳහන්ය. අනුමැතියකින් තොරව මෙම තනතුර පිරිනමා උසස්වීම්, වරදාන ලබා දීම නීතියට පටහැනි බැවින් අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කරන ලෙස යෝජනා කරමි.

**ඩී.එම්.ඩී. දිසානායක මහත්මිය විසින් කර ඇති මෙම සියළුම යෝජනාවන් සාමාජික අංක 31054 හිමි ඩී.ඩී.පී. දිසානායක මහතා විසින් ස්ථිර කරන ලදි.**

**ඒ අනුව භාණ්ඩාගාර නියෝජිත ඩබ්.ඒ.එස්. ඉරෝෂන් මහතා විසින් මෙම සියළුම පෞද්ගලික යෝජනාවන් ඊළග කළමනාකරණ කමිටුවට යොමුකර එහිදී දීර්ඝව සාකච්ඡා කර ගනු ලබන තීරණ සම්බන්ධයෙන් ඉදිරි කටයුතු කරන බව දන්වන ලදි.**

**<u>පෞද්ගලික යෝජනා සම්බන්ධයෙන් ඉදිරිපත්වූ තවත් අදහස්</u>**

**<u>1.පී.ජී.එස්. සමරක්කොඩි මයා - සා.අංක 25299</u>**

මෙම පෞද්ගලික යෝජනා වල ඇතුළත් හොඳ යෝජනා සම්බන්ධව අවධානය යොමු කිරීම සුදුසු බවත් ගණකාධිකාරී තනතුරට පත් කර ගැනීම සම්බන්ධව බඳවා ගැනීමේ පටිපාටියක් නොතිබූ හෙයින් එය සකස් කර ඇති බවත් ප්‍රකාශ කරන ලදී.

තවද යම් සාමාජිකයෙකු සම්බන්ධයෙන් වංචාවක් පිළිබඳව චෝදනාවක් පවතී නම් අදාල ආයතන වලින් සංගමය වෙත දැනුම් දීමක් කරන බැවින් එම යෝජනා දෙකම අයින් කර ගන්නා ලෙස ඉල්ලා සිටින ලදී.

**<u>2. ඩී.ඩී.පී.දිසානායක මයා - සා.අංක 31054</u>**

යම් හෙයකින් විධිමත් විනය ක්‍රියාමාර්ගයකින් පසුව වරදකරුවෙකු වූ සාමාජිකයෙකුට අපේක්ෂකයෙකු වශයෙන් ඉදිරිපත් වීමට හෝ ධූරය දැරීමට අවසර ලබාදීම වසර 05 කට අත්හිටුවීම සුදුසු බවට යෝජනාවක් ගෙන එන ලදි.

**<u>3. පී.ඒ.ජී.ගයම්පත් මයා - සා.අංක 26120</u>**

විශේෂයෙන්ම ඩී.එම්.ඩී.දිසානායක මහත්මිය විසින් කරන ලද යෝජනා සම්බන්ධයෙන් සිය අදහස් පල කල අතර ද්විතීයන පදනම මත බඳවා ගනු ලබන නිලධාරීන් රාජ්‍ය සේවා කොමිෂන් සභාවෙන් නිදහස්කර ගැනීමේදී සැලකිය යුතු කාලයක් ගතවන හෙයින් ඒකාබද්ධ ලේකම් හා භාණ්ඩාගාරික හා සහකාර ලේකම් යන තනතුරු සඳහා නිලධාරීන් බඳවා ගත්තද ඔවුන් සේවයට වාර්තා කරන තෙක් සංගමයේ අත්‍යවශ්‍ය රාජකාරී හා සේවාවන් අඛණ්ඩව සැපයිය යුතු නිසා සභාපතිවරයාට ලේකම්වරයාගේ කාර්යයන්ද ඉටුකිරීමට සිදුවන බව දන්වන ලදි.
තවදුරටත් ඒ මහතා විසින් අදහස් දක්වමින් පසුගිය නිලවරණයට අදාල සියළුම පූර්ව කටයුතු සභාපති හා භාණ්ඩාගාරික නියෝජිතයින් විසින් ඉටුකල බවත් කළමනාකරණ කමිටුව එයට සම්බන්ධ නොවූ බවත් ප්‍රකාශ කරන ලදී.

එමෙන්ම රාජ්‍ය සේවයේ යෙදී සිටින සාමාජිකයින් හට එකම වරදක් වෙනුවෙන් දඩුවම් දෙකක් ලබා දීම අවශ්‍ය නොවන බව ප්‍රකාශ කළ අතර භාණ්ඩාගාර නියෝජිතයින් ලෙස පරිපාලන සේවයට සමාන්තර වෙනත් සේවාවල අයට ඉදිරිපත් වීමට පනත ප්‍රකාරව හැකියාවක් නොමැති ද යන්න විමසන ලදී.

එම අවස්ථාවේදී අදහස් දක්වමින් භාණ්ඩාගාර නියෝජිත ඩබ්.ඒ.එස්.ඉරෝෂන් මහතා විසින් මුදල් අමාත්‍යාංශයේ ලේකම්වරයා විසින් පත් කළ නිලධාරින් පනත ප්‍රකාරව පත් කර ඇති බව නිරික්ෂණය වන බව ප්‍රකාශ කරන ලදී.
පෞද්ගලික යෝජනා මහා සභාවේදී ස්ථිර කල පමණින් ඒවා අනුමත වූ යෝජනාවන් ලෙස පිලිගැනීමට නොහැකි බව පී.ඒ.ජී.ගයම්පත් මහතා තවදුරටත් ප්‍රකාශ කරන ලදි.

**<u>4. එන්.ෆ්‍රැන්සිස්කු මයා- සා.අංක 16988</u>**

තමා විසින් කමිටුව නියෝජනය කරන කාලයේදී බඳවා ගැනීම් පරිපාටියක් නොතිබූ අතර එම බඳවා ගැනීම් පරිපාටි නිසි ආකාරයෙන් සකස් කර ගණකාධිකාරි තනතුරට බඳවා ගත් බවත් දැනට සේවයේ නියුතු ගණකාධිකාරිවරියට සහ තවත් සුදුසුකම් සපුරා තිබූ තිදෙනෙකුට තමා දුරකථනයෙන් කතා කළ බවත් ඒ අය වෙනත් රැකියාවල නියුතු වී සිටීම නිසා නොපැමිණි හෙයින් වත්මන් නිලධාරිනිය බඳවා ගැනීමට කටයුතු කළ බව දැනුම් දෙන ලදී.

**<u>5. ඩබ්.එච්.එස්.පී.පී.කුලවංශ මයා - සා.අංක 18603</u>**

තමා සභාපති ලෙස කටයුතු කළ අවධියේදී මෙම සංගමයේ ගිණුම්වල පැවති ගැටලුකාරි තත්වය නිසා ගණකාධිකරණය විෂය දැනුම ඇති අයෙකු අවශ්‍ය හෙයින් එම සුදුසුකම් ඇති අයෙකු බඳවාගෙන ඇති බව දැනුම් දෙන ලදි.

**<u>6.ඒ.එම්.යූ.පී.අධිකාරී මයා- සා.අංක 21123</u>**

සුදුසුකම් සහිත අයෙකු ගණකාධිකාරී තනතුරට බඳවා ගෙන තිබෙන නිසා මේ සම්බන්ධයෙන් කර ඇති යෝජනා ප්‍රතික්ෂේප කල යුතු බව ප්‍රකාශ කරන ලදි.

**<u>7.අයි.සී.ගමගේ මයා- සා.අංක 28697</u>**

මෙය මූල්‍ය ආයතනයක් බැවින් සංගමයේ ගුණාත්මකභාවය ආරක්ෂා කර ගැනීම සඳහා මූල්‍යමය චෝදනා ඇති අයවලුන් සිටීනම් ඔවුන් ස්වෙච්ඡාවෙන්ම කමිටුවට ඉදිරිපත් නොවිය යුතු බව පවසන ලදි. එමෙන්ම

ඉදිරිපත් කරනු ලබන පෞද්ගලික යෝජනාවල නීත්‍යානුකූලභාවය පිළිබඳව සනාථ කර ගැනීම සඳහා කළමනාකරණ කමිටුවේදී සාකච්ඡා කර ඉදිරිපත් කිරීමට සුදුසු බව දැනුම් දෙන ලදි.

**<u>8. පී.ජී.විජේසිංහ මයා - සා.අංක 22036</u>**

චෝදනා ලැබූ පමණින් යමෙකු වැරදිකරුවෙකු නොවන හෙයින් වරදකරුවෙකු වූ බවට සනාථ වුවහොත් පමණක් කමිටුවේ තනතුරු අහෝසි කිරීම සුදුසු බව ප්‍රකාශ කරන ලද අතර මෙම නීතිය කමිටුවට මෙන්ම සාමාජිකත්වයටද පොදු විය යුතු බව දැනුම් දෙන ලදි.

**<u>9.ඩී.එම්.දයානි දිසානායක මිය- සා.අංක 16767</u>**

පනත ප්‍රකාරව ගැටළු හා මතභේදාත්මක අවස්ථාවලදී භාණ්ඩාගාර ලේකම් බේරුම්කරුවා වන හෙයින් ලේකම් වරයෙකු නොමැති අවස්ථාවක්ද ගැටළුකාරී අවස්ථාවක් වන හෙයින් භාණ්ඩාගාර ලේකම්වරයාගේ අනුමැතිය මත පමණක් සභාපතිවරයාට ලේකම්වරයාගේ කාර්යයන් ඉටුකල හැකි බව දැනුම් දෙන ලදි.

**<u>10. ඩී.පී.සමරසිංහ මයා- සා.අංක 14079</u>**

තමා හොඳින් පනත අධ්‍යනය කර ඇති බවත් සභාපතිවරයාට ලේකම්වරයා නොමැති අවස්ථාවේදී ලේකම්වරයාගේ කාර්යයන් ඉටු කල හැකි බවත් පවසන ලදි.

## <u>16. සාමාජිකයින් පළ කළ විවිධ අදහස්.</u>

**<u>1. ඩී.එම්.ඩී.දිසානායක මිය - සා.අංක 16767</u>**

වසර පුරා ගන්නා ලද කළමනාකරණ කමිටු තීරණ සංගමයේ වෙබ් අඩවියේ ප්‍රසිද්ධ කළ යුතු බවට යෝජනා කරන ලදී. ගණකාධිකාරි තනතුරට පත්කිරීම සම්බන්ධයෙන් වන විමර්ශන කමිටු වාර්තාව ඊළඟ මහා සභාවට ඉදිරිපත් කළ යුතු බව යෝජනා විය.

**<u>2. සී.ඩී.අයි.ගුණසේකර මයා</u>**

සියලුම ණය වර්ග මාස 06 න් 06 ට අලුත් කිරීමට ඉඩ ප්‍රස්ථාව ලබා දෙන ලෙස ඉල්ලා සිටි අතර දැනටමත් එම ක්‍රමවේදය ක්‍රියාත්මක වන බව සභාපතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

**<u>3.ඩී.එම්.ඒ.කුමාර මහතා - සා.අංක 32117</u>**

1. සියලුම ණය වර්ගවල පොලී අනුපාතයන් අඩු කිරීම.
2.වර්තමානයට ගැලපෙන පරිදි ණය සීමාවන් යාවත්කාලීන කිරීම
3. සංගමයේ වෙබ්අඩවිය ආකර්ශනීය ලෙස සකස් කිරීම
4. ආකර්ශනීය සාමාජික ප්‍රවර්ධන වැඩසටහන් සංවිධානය කිරීම
5.විශ්‍රාමිකයින් හට ඔවුන් සංගමය වෙනුවෙන් කරන ලද සේවය පිළිබඳව සලකා බලා පොලිය අය නොකර වාරික පමණක් අයවන සේ සුබසාධන ණය ක්‍රමයක් හඳුන්වා දීම.
6. නවීන තාක්ෂණය උපයෝගී කරගෙන සාමාජිකයින් හට ණය ගන්නා අවස්ථා වලදී අදාල කෙටි පණිවිඩ යොමු කිරීම.
7. වර්ෂය ආරම්භයේදී සියලුම සාමාජිකයින් හට සංගමයේ සාමාජිකත්වයද සිහි ගන්වමින් සුභපැතුම් පතක් යැවීම සුදුසු බව.

## <u>17.ඡන්දය ප්‍රකාශ කිරීම අවසන් කිරීම.</u>

ප.ව 2.00 ට ඡන්දය ප්‍රකාශ කිරීම අවසන් කරන බව සංගමයේ සභාපතිතුමා විසින් සභාව වෙත දැනුම් දෙන ලදී.

**18.** සහකාර ලේකම්තුමියගේ ස්තූති කතාවෙන් පසු සභාවේ මූලික කටයුතු ප.ව 2.30 ට පමණ අවසන් කරන ලදී.

**19.** රාත්‍රී 10.00 ට පමණ ඡන්දය ගණන් කිරීම් කටයුතු අවසන් වූ අතර,මුදල් අමාත්‍යාංශයේ අධ්‍යක්ෂ එම්.ඒ කරුණාරත්න මහතා විසින් සමස්ත අපේක්ෂක ඡන්ද ප්‍රතිඵල නිකුත් කරන ලදී.

| | | |
|---|---|---|
| 1) පැමිණි සාමාජික සංඛ්‍යාව | - | 2874 |
| 2) නිකුත් කළ ඡන්ද පත්‍රිකා සංඛ්‍යාව | - | 2829 |
| 3) ප්‍රකාශිත වලංගු ඡන්ද සංඛ්‍යාව | - | 2696 |
| 4) ප්‍රතික්ෂේපිත ඡන්ද සංඛ්‍යාව | - | 133 |

2024/2025 කළමනාකරණ කමිටුව සඳහා ඉදිරිපත් වූ අපේක්ෂකයින් සංඛ්‍යාව හා ලබාගත් ප්‍රතිඵල පහත පරිදි වේ.

| අනු අංකය | අපේක්ෂකයාගේ නම | ලබා ගත් ඡන්ද සංඛ්‍යාව |
|---|---|---|
| 01 | කේ.එන්.ඩී.ජයසුන්දර මිය | 1039 |
| 02 | ඉරේෂා අතුරලිය මිය | 1028 |
| 03 | නාමලී මාකලන්දාව මිය | 903 |
| 04 | නාමල් ජයසිංහ මයා | 882 |
| 05 | දිලිනි අසෝකා ජයවර්ධන මිය | 872 |
| 06 | ඊ.එස්.සුරංග පෙරේරා මයා | 843 |
| 07 | අනුලා විතානගේ මිය | 806 |
| 08 | ජයලත් සමන් කුමාර මයා | 806 |
| 09 | එම්.එස්.මංගලිකා පෙරේරා මිය | 781 |
| 10 | අනුර වීරසිරි මයා | 737 |
| 11 | දයානී දිසානායක මිය | 724 |
| 12 | ඊ.ඒ.ජී.සරත් පෙරේරා මයා | 714 |
| 13 | අයි.එච්.එම්.එම්.පුෂ්පකුමාරි මිය | 708 |
| 14 | කේ.ටී.ජී.එස්.කාරියවසම් මිය | 701 |
| 15 | පී.ජී.විජේසිංහ මයා | 691 |
| 16 | පී.ඒ.ගනීෂ ගයම්පත් මයා | 677 |
| 17 | සේනක පෙරේරා මයා | 639 |
| 18 | බුද්ධික විජේසිංහ මයා | 626 |
| 19 | බී.තෙබුවන මයා | 588 |
| 20 | හරින්ද්‍ර වැලිවිට මයා | 491 |
| 21 | කරුණාදාස හෙන්දා විතාරණ මයා | 442 |
| 22 | හෙට්ටි ආරච්චිගේ සමන්ත මයා | 415 |
| 23 | ෂර්ලිස්ටැන්ලිඇලෝසියස්මයා | 382 |
| 24 | ජනක සංජීව රුවන් කුමාර මයා | 348 |
| 25 | ඩී.පී.සමරසිංහ මයා | 307 |
| 26 | එල්.අභයවර්ධන මයා | 275 |
| 27 | එස්.ගොඩගේ මයා | 261 |

**20.** නිල ප්‍රතිඵල අනුව එක් එක් අපේක්ෂකයින් ලබා ගත් ඡන්ද සංඛ්‍යාව හා තේරී පත්වූ කමිටු සාමාජිකයින් කවුරුන්ද යන්න මැතිවරණ නිලධාරි ලෙස කටයුතු කළ මුදල් අමාත්‍යාංශයේ අධ්‍යක්ෂ එම්.ඒ කරුණාරත්න මහතා විසින් ප්‍රකාශ කරන ලදී. ඒ අනුව පත්වූ අපේක්ෂකයින් හා ලබාගත් මනාප ප්‍රතිඵල පහත පරිදි වේ.

| අනු අංකය | අපේක්ෂකයාගේ නම | ලබා ගත් ඡන්ද සංඛ්‍යාව |
|---|---|---|
| 01 | කේ.එන්.ඩී.ජයසුන්දර මිය | 1039 |
| 02 | ඉරේෂා අතුරලිය මිය | 1028 |
| 03 | නාමලී මාකලන්දාව මිය | 903 |
| 04 | නාමල් ජයසිංහ මයා | 882 |
| 05 | දිලිනි අසෝකා ජයවර්ධන මිය | 872 |
| 06 | ටී.එස්.සුරංග පෙරේරා මයා | 843 |
| 07 | අනුලා විතානගේ මිය | 806 |
| 08 | ජයලත් සමන් කුමාර මයා | 806 |
| 09 | එම්.එස්.මංගලිකා පෙරේරා මිය | 781 |
| 10 | අනුර වීරසිරි මයා | 737 |
| 11 | දයානී දිසානායක මිය | 724 |

මෙම ප්‍රතිඵල මුදල් අමාත්‍යාංශයේ අධ්‍යක්ෂ එම්.ඒ කරුණාරත්න මහතා විසින් සභාව ඉදිරියේ ප්‍රකාශයට පත් කරන ලදී.

සංගමයේ සභාපතිතුමා විසින් පත්වූ අභිනව කමිටු සභිකයින් වෙත සුභාශිංශන පිරිනැමූ අතර සහකාර ලේකම්තුමිය විසින් සියලුම පාර්ශවයන් හට ස්තූතිය පළ කරමින් රාත්‍රී 11.00 ට පමණ 140 වැනි සංවත්සරික මහා සභාවේ සමාප්තිය සනිටුහන් කරන ලදී.

ආචාර්ය එච්.ඒ.එන්.එස්.කුමාර
සභාපති

එන්.ජේ.ඩබ්.වයි.නානායක්කාර
ඒකාබද්ධ ලේකම් හා භාණ්ඩාගාරික

රාජ්‍ය සේවා අන්‍යෝන්‍යාධාර අර්ථසාධක සංගමය.
24.07.2025

**<u>140 වන වාර්ෂික මහ සභා රැස්වීමට ඉදිරිපත් කරන ලද පෞද්ගලික යෝජනා සම්බන්ධයෙන් ගෙන ඇති ක්‍රියාමාර්ග</u>**

**<u>යෝජනා අංක 01:-</u>**
**<u>කේ.ඩී.බී. පෙරේරා මිය ( සා. අංක 13096)</u>**

**"ඒකාබද්ධ ලේකම් හා භාණ්ඩාගාරික තනතුර සඳහා සංගමයේ සාමාජිකත්වය නොමැති අය පත් නොකළ යුතුය, යන්න සංගම් ආඥා පනතේ ව්‍යවස්ථාවලියේ රීතියට ඇතුලත් කර ගැනීම සඳහා අද දින මහ සභාවෙන් සම්මත කර ගන්නා ලෙස ගෞරවයෙන් ඉල්ලා සිටින්නීය."**

රාජ්‍ය සේවා අන්‍යෝන්‍යාධාර අර්ථ සාධක සංගම් කාර්ය පටිපාටි සංග්‍රහයේ 2.2.1 ට අනුව සංගමයේ ඒකාබද්ධ ලේකම් හා භාණ්ඩාගාරික තනතුරට පත් කල යුතු තැනැත්තා සාමාජිකයෙකු විය යුතු බව සඳහන් කර ඇත.

ඒ අනුව අවස්ථා කිහිපයකදී ම මෙම විධිවිධාන සඳහන් කරමින් ඉහත තනතුරේ පුරප්පාඩු සඳහා පුවත්පත් දැන්වීම් පළ කර සාමාජිකයින් අතුරින් අයදුම්කරුවන් කැඳවූව ද කිසිදු අයදුම්කරුවෙකු එම තනතුර සඳහා අයදුම් නොකල අවස්ථා පැන නැගී ඇති අතර ඒකාබද්ධ ලේකම් හා භාණ්ඩාගාරික තනතුරෙහි පුරප්පාඩු සහිතව වසර ගණනාවක් කාර්යාලීය කටයුතු සිදු කර ගෙන ගොස් ඇති බවට තොරතුරු වාර්තා වී ඇත. මින් පෙර සංගමයේ සාමාජිකයින් නොවන අයගෙන් ද අයදුම්පත් කැඳවා අදාල තනතුර සඳහා අවස්ථා කිහිපයකදී ම බඳවා ගෙන ඇති බවට පූර්වාදර්ශයන් ද පවතී.

| | | | |
|---|---|---|---|
| උදා:- | නිමල් ප්‍රනාන්දු මයා | ඒකාබද්ධ ලේකම් හා භාණ්ඩාගාරික | - (1990 - 1991) |
| | ඩබ්.එල්.උපාලි මයා | ඒකාබද්ධ ලේකම් හා භාණ්ඩාගාරික | - (2004 - 2006) |
| | සමන් ගුණදාස මයා | ඒකාබද්ධ ලේකම් හා භාණ්ඩාගාරික (වැ.බ) | - (2016 - 2018) |
| | අශෝක පිරිස් මයා | ඒකාබද්ධ ලේකම් හා භාණ්ඩාගාරික | - (2021 - 2024) |

ඒ අනුව, එවන් අවස්ථාවලදී ඒකාබද්ධ ලේකම් හා භාණ්ඩාගාරික තනතුරට නිලධාරියෙකු පත් කර ගැනීම සම්බන්ධයෙන් පැවති ගැටළුකාරී තත්වයන් වැළැක්වීම සඳහා වැඩි පිරිසකට අයදුම් කල හැකි පරිදි කළමනාකරණ කමිටු තීරණයන් මත සාමාජික සහ සාමාජික නොවන අයගෙන් අයදුම්පත් කැඳවා එකාබද්ධ ලේකම් හා භාණ්ඩාගාරික තනතුරට නිලධාරියෙකු පත් කර ගැනීමට කටයුතු කර ඇත.

**<u>යෝජනා අංක 02:-</u>**
**<u>ඩී.එම්. දයානී දිසානායක මිය. ( සා. අංක 16767)</u>**

01 <u>යෝජනාව :-</u>

**I. පනත හා රීති ප්‍රකාරව රැස්වීම් කැඳවීමේ නිවේදන නිකුත් කිරීම සහ නාමයෝජනා කැඳවීම එකාබද්ධ ලේකම් හා භාණ්ඩාගාරික විසින් සිදු කල යුත්තේය.**

පසුගිය වාර්ෂික මහා සභා වාරවලදී ඉහත යෝජනා කර ඇති අයුරින් කටයුතු කර ඇති බව නිරීක්ෂණය වන අතර 140 වාර්ෂික මහ සභා රැස්වීම පැවැත්වීම ට නියමිත වකවානුවේ දී සංගමයට ඒකාබද්ධ ලේකම් හා භාණ්ඩාගාරිකවරයෙකු හෝ සහකාර ලේකම්වරයෙකු නොසිටීම හේතුවෙනුත්, වෙනත් විකල්පයක් නොමැති වීම හේතුවෙනුත්, වාර්ෂික මහා සභා රැස්වීම අත්‍යවශයෙන් පැවැත්විය යුතුව ඇති නිසාත්, සභාපතිවරයා විසින් ඉහත කාර්යයන් ඉටු කර ඇති අතර ඊට අමතරව සාමාජිකයින්ට අපහසුතාවයක් ඇති නොවන පරිදි ලේකම්වරයෙකුගෙන් ඉටුවිය යුතු සංගමයේ සියළුම කාර්යයන් ද, සභාපතිවරයා විසින් ඉටු කර ඇත. මේ වන විට සංගමයේ ඒකාබද්ධ ලේකම් හා භාණ්ඩාගාරික තනතුරේ සහ සහකාර ලේකම් තනතුරේ පුරප්පාඩු සම්පූර්ණ වී ඇත.

**II. නාමයෝජනා කැඳවීමේ සිට සියළු නිලවරණ කටයුතු සංගමයේ විධායක නිලධාරීන් දෙදෙනා වන ලේකම් හා සහකාර ලේකම්ගේ කර්තව්‍ය සභාපතිවරයා විසින් පමණක් අධීක්ෂණය කළ යුතුය. නිලවරණ අපේක්ෂකයින් වන පාලන කමිටු සාමාජිකයින් විසින් නිලවරණ පැවැත්වීම සඳහා පද්ධති හා සම්ප්‍රදාය වෙනස් කිරීම, ඡන්ද කූපන් පත් හා ටෝකන් පත්‍ර මුද්‍රණය කිරීම හා සැලසුම් කිරීම සම්බන්ධයෙන් ඍජුව හෝ වක්‍රව දායකත්වය සැපයීම, බලපෑම් ඇති කිරීම නොකල යුතුය.**

140 මහා සභාවේ කමිටු නිලවරණයට අදාළ සියළුම පූර්ව කටයුතු සංගමයේ සභාපති ප්‍රමුඛ කාර්යාලයේ කාර්ය මණ්ඩලය විසින් සිදු කර ඇති අතර මෙවර (141) නිලවරණයට අදාළ සියළුම කටයුතු සභාපතිගේ අධීක්ෂණය යටතේ භාණ්ඩාගාර නියෝජිතයින්ගේ මග පෙන්වීම මත ඒකාබද්ධ ලේකම් හා භාණ්ඩාගාරික ඇතුළු කාර්යාලයේ කාර්ය මණ්ඩලය විසින් සංවිධානය කරන ලදී.

තවද ඡන්ද පත්‍රිකා මුද්‍රණය කිරීම, ඡන්ද පත්‍රිකා කූපන් මුද්‍රණය කිරීම, සහ ටිකට් පොත් මුද්‍රණය කිරීමේ කටයුතු සඳහා කළමනාකරණ කමිටු සභිකයින් සහභාගී නොවිය යුතු බවට 2025.07.03 පැවැති විශේෂ කළමනාකරණ කමිටු රැස්වීමේ දී තීරණයක් ද ගන්නා ලද අතර ඉදිරියේ දී ද ඒ අයුරින් කටයුතු කරනු ලැබේ.

**III. නිලවරණ අපේක්ෂක අංක ලබා දීම ඉංග්‍රීසි අක්ෂර අකාරාදි පිළිවෙලම මින් ඉදිරියට ක්‍රියාත්මක විය යුත්තේය.**

කමිටු නිලවරණයේ දී අපේක්ෂක අංක ලබා දිය යුතු ආකාරය පිලිබඳව තීරණයක් ගැනීමට මහා සභාවට අවස්ථාව ලබා දෙමින් 141 වැනි වාර්ෂික මහා සභාවට ඒ සම්බන්ධයෙන් නිලයෝජනාවක් ඉදිරිපත් කිරීමට කටයුතු කර ඇත.

<u>**02 යෝජනාව :-**</u>

**යම් වංචා චෝදනාවක් සම්බන්ධයෙන් එම සාමාජිකයාට විරුද්ධව විනයානුකූල පරීක්ෂණ සිදු වෙමින් පවතින විට හෝ චෝදනා ඔප්පු වී වරදකරුවෙකු බවට ඔප්පු වී ඇත්නම් එවැනි සාමාජිකයෙකු කළමනාකරණ කමිටුවේ සාමාජිකයෙකු ලෙස තරඟ කිරීමට, ධූර දැරීමට ද නුසුදුස්සෙකු වන්නේය.**

රාජ්‍ය සේවා අන්‍යෝන්‍යාධාර අර්ථ සාධක සංගම් ව්‍යවස්ථාවේ රීති අංක 7(අ) (i) ප්‍රකාරව සේවයෙන් පහ කරන ලද සාමාජිකයෙකුගේ සාමාජිකත්වය අහෝසි වන අතර එසේ සේවයෙන් පහ කරන ලද සාමාජිකයින්ගේ තොරතුරු සංගමය වෙත වාර්තා වූ සැනින් එම සාමාජිකයින්ගේ සාමාජිකත්වය අහෝසි කිරීමට පියවර ගනු ලැබේ.

එමෙන්ම 140 කමිටු නිලවරණයට ඉදිරිපත් වූ අපේක්ෂකයින් සම්බන්ධයෙන් විනයානුකූල පරීක්ෂණ පැවැත්වෙන බව හෝ විනය චෝදනා ඔප්පු වී වැරදිකරුවෙකු වී ඇති බවට හෝ තොරතුරු වාර්තා වී නොමැති අතර ඒ බව 140 වාර්ෂික මහා සභා රැස්වීමේ දී ද, සභාපතිවරයා විසින් මහා සභාවට දන්වා සිටින ලදී.

<u>**03 යෝජනාව :-**</u>

**1973 අංක 54 සංශෝධිත 474 අධිකාරියෙහි පනවා ඇති,**

**4 .a භාණ්ඩාගාර ලේකම්වරයා විසින් පත් කරනු ලබන සභාපතිවරයා ශ්‍රී ලංකා පරිපාලන සේවයට අයත් නිලධාරියෙකු විය යුතුය.**

**4. b භාණ්ඩාගාර ලේකම්වරයා විසින් පත් කර එවන නම් කළ කමිටු සභික දෙදෙනාගෙන් එක් අයෙකු ශ්‍රී ලංකා ගණකාධිකාරී සේවයේ නිලධාරියෙකු හා අනෙක් නිලධාරියා ද, ශ්‍රී ලංකා පරිපාලන සේවයට අයත් නිලධාරියෙකු විය යුතුය.**

1973 අංක 54 දරණ රාජ්‍ය සේවා අන්‍යෝන්‍යාධාර අර්ථ සාධක සංගම් (සංශෝධන) පනතේ 4(1)(අ) සහ 4(1)(ආ) වගන්ති ප්‍රකාරව සඳහන් කර ඇත්තේ " සංගමයේ සාමාජික වුත් සිවිල් ලැයිස්තුවේ නම් දැක්වෙන නිලධරයෙකුගේ තත්ත්වයට අඩු නොවූත් ...." යනුවෙනි. ඒ අනුව භාණ්ඩාගාර ලේකම් විසින් රාජ්‍ය සේවා අන්‍යෝන්‍යාධාර අර්ථ සාධක සංගමය වෙනුවෙන් පත් කර ඇති සභාපතිවරයා සහ භාණ්ඩාගාර නියෝජිතයින් දෙදෙනා ඉහත පනතෙහි දැක්වෙන විධිවිධාන ප්‍රකාරව පත් කර ඇත. තවද

මේ සම්බන්ධයෙන් තීරණ ගැනීම පනත ප්‍රකාරව භාණ්ඩාගාර ලේකම්ගේ අභිමතය පරිදි සිදු වීම සුදුසු බව 2025.07.24 දින පැවැති කළමනාකරණ කමිටුවේ දී තීරණය කරන ලදී.

**04 යෝජනාව :-**

**2016 අංක 12 දරණ තොරතුරු දැන ගැනීමේ පනතේ විධිවිධාන මෙම ආයතනයට ද බලගැන්වීම සිදු කළ යුතුව අතර සාමාජිකයින් විසින් ඉල්ලා සිටින තොරතුරක් සැපයීම සඳහා තොරතුරු නිලධාරියෙකු පත් කල යුතුය, එම තනතුර නිල බලයෙන් සංගමයේ ඒකාබද්ධ ලේකම් හා භාණ්ඩාගාරික වෙත පැවරීම සුදුසු යැයි යෝජනා කරමි.**

2016 අංක 12 දරණ තොරතුරු දැන ගැනීමේ පනතේ විධිවිධාන ප්‍රකාරව රාජ්‍ය සේවා අන්‍යොන්‍ය අර්ථ සාධක සංගමයේ තොරතුරු නිලධාරියා වශයෙන් සංගමයේ ඒකාබද්ධ ලේකම් හා භාණ්ඩාගාරිකවරයා මේ වන විටත් පත් කර ඇත.

**05 යෝජනාව :-**

**යම් වාර්ෂික මහ සභාවක් විසින් යෝජනා අනුමැතියකින් සම්මත වූ කාරණාවක් ඊළඟ මහා සභා රැස්වීමට ප්‍රථම නීතියක් බවට බලගැන්වීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම සභාපතිවරයාගේ ද නම් කළ කමිටු සාමාජිකයින් දෙදෙනාගේ ද සහ ඡන්දයෙන් පත් වන කළමනාකරණ කමිටු සාමාජිකයන්ගේ ද වගකීම වන්නේය . එම වගකීම අත්හල නොහැක්කේය.**

ඉහත යෝජනාව හා එකඟ වන අතර මේ වන විට මුදල් අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කලත්, රජයේ ගැසට් පත්‍රයේ පළ කිරීමට ප්‍රමාද වී ඇති 132, 133, 134 සහ 135 යන වාර්ෂික මහා සභා රැස්වීම්වලදී සම්මත වී ඇති රීති සංශෝධනයන් අදාල නිවැරදි කිරීම් සිදු කර මුදල් අමාත්‍යාංශ ලේකම් වෙත යොමු කර ඇත. මේ සම්බන්ධයෙන් පහත සඳහන් දින සහිතව මුදල් අමාත්‍යාංශය හා සංගමය අතර ලිපි කිහිපයක්ම හුවමාරු වී ඇති අතර මේ වනවිටත් ඒ සම්බන්ධයෙන් සංගමය විසින් මුදල් අමාත්‍යාංශයෙන් විමසීම් කර ගෙන යනු ලැබේ.

(2021.11.16 / 2021.11.19/ 2022.02.23/ 2022.12.24/ 2023.01.18/ 2023.03.08/ 2023.05.30/ 2024.01.12/ 2024.03.08/ 2025.06.18)

එමෙන්ම 137, 138 හා 139 යන මහා සභා රැස්වීම් වලදී අනුමත වූ රීතින්ද මේ වන විට මුදල් අමාත්‍යාංශ ලේකම් වෙත යොමු කර ඇත.

**06 යෝජනාව :-**

**I. 139 වාර්ෂික මහා සභා රැස්වීමේ දී අනුමත, පනවා ගත් සියළුම නීති බලගැන්වීමට පාලන කමිටුව කටයුතු කල යුත්තේය.**

මේ වන විට 139 වාර්ෂික මහා සභා රැස්වීමේ දී අනුමත වු රීතින්ද මුදල් අමාත්‍යාංශ ලේකම් වෙත යොමු කර ඇත.

**II. සංගමයේ කාර්ය මණ්ඩලයට අනුමත නොවූ තනතුරක් වන ගණකාධිකාරී තනතුර යටපත් කොට සංගමයට අත්‍යවශ්‍ය තනතුරක් වන අභ්‍යන්තර විගණක තනතුරක් පිහිටුවීම හා බඳවා ගැනීමේ පටිපාටිය සකස් කිරීමට සහ ගණකාධිකාරී තනතුර සඳහා කර ඇති පත් කිරීම පිළිබඳව විමර්ශනයක් කිරීම සඳහා කළමනාකරණ කමිටුවෙන් පරිබාහිර විමර්ශන කමිටුවක් පිහිටුවා එම කර්තව්‍ය එම කමිටුවට භාරදිය යුතුය යැයි යෝජනා කරමි.**

දැනට සංගමයේ පවතින අතිශය සංකීර්ණ සහ පුළුල් ගිණුම් ක්‍රියාවලිය සහ වත්කම් ප්‍රමාණයත් දිනෙන් දින වැඩි වන මෙහෙයුම් ප්‍රමාණයත් හේතුවෙන් මෙහෙයුම් කාර්යක්ෂමතාවය හා නිරවද්‍යතාවය තහවුරු කිරීම මෙන්ම සාමාජිකත්වයට වගවීම පිළිබඳව අවධානය යොමු කරමින් ගණකාධිකාරී තනතුරට අමතරව සහකාර ගණකාධිකාරී සහ අභ්‍යන්තර විගණක වශයෙන් නව තනතුරු දෙකක් ඇති කිරීම සුදුසු බවට නිල යෝජනාවක් මෙවර (141) මහා සභා රැස්වීමට ඉදිරිපත් කිරීමට පියවර ගෙන ඇත.

ගණකාධිකාරී තනතුර සඳහා කර ඇති පත් කිරීම පිළිබඳව විමර්ශනයක් සිදු කිරීම සඳහා කළමනාකරණ කමිටු සභිකයින්ගෙන් පත් කරන ලද විමර්ශන කමිටුවකට පවරා ඇති අතර එම වාර්තාව මෙවර මහා සභාවට ඉදිරිපත් කිරීමට කටයුතු කරනු ඇත.

141 වන කළමනාකරණ වාර්තාව

**සංයුක්ත තොරතුරු**

සංගමයේ නම : රාජ්‍ය සේවා අන්‍යෝන්‍යාධාර අර්ථ සාධක සංගමය

සංස්ථාපිත දිනය : **1891** ඔක්තෝම්බර් **04** වන දින (**1891** අංක **05** දරණ ආඥා පනත යටතේ)

කාර්යාලීය ලිපිනය : නො.**155/5,** කාසල් වීදිය, කොළඹ **08.**

විගණකවරු : විගණකාධිපති, විගණකාධිපති දෙපාර්තමේන්තුව

බැංකුකරුවන් : ලංකා බැංකුව, මහජන බැංකුව

**කළමනාකරණ කමිටුව**

01. සභාපති

**ආචාර්ය එච්.ඒ.එන්. නීල් සමන් කුමාර මයා,** අධ්‍යක්ෂ, රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව

02. භාණ්ඩාගාර නම් කළ කමිටු සභික

**ඩබ්.ඒ. සුරංක ඉරෝෂන් මයා**, අධ්‍යක්ෂ (වැ.බ.)
ජාතික ක්‍රම සම්පාදන දෙපාර්තමේන්තුව

**එන්.කේ. සමන් චන්ද්‍රසේකර මයා**, සහකාර අධ්‍යක්ෂ
